Ministry of Indigenous Medicine Sri Lanka





# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT
# 2012



Design By : D.G.R.T.Panduka







Web : www.indigenousmedimini.gov.lk

https://www.facebook.com/pages/Ministry-of-Indigenous-Medicine/130748173783098

# දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

# කාර්ය සාධන වාර්තාව - 2012

# ගරු දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



මිනිසාගේ ආරම්භය වෛද්‍ය ඥානයේද ආරම්භයයි. ශිෂ්ඨාචාරවත් වූ සෑම සමාජයකම ඔවුන්ගේ පරිසරය පදනම් කරගත් වෛද්‍ය ඥානයක් හා වෛද්‍ය ක්‍රමයක් පැවති බවට ඓතිහාසික ශිෂ්ඨාචාරයන්හි සාක්ෂි එමට ඇත.එම ඓතිහාසික වෛද්‍ය ක්‍රම අතර ලොව පැරණිතම වූ ද පැරණි ලොව අග්‍රතම වූ ද වෛද්‍ය ක්‍රමය ත්‍රිදෝෂමත පදනම් වූ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයයි. ඉංදු ගංගා මහා තැනිතලාවේ වසර පන්දහසකට ආසන්න ඉතිහාසයක් පුරා හැදී වැඩී පෝෂණය වූ මෙම වෛද්‍ය ක්‍රමය දකුණු ආසියාව පුරා විහිදුණු සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රමයක්ව පැවතිණි.

ආයුර්වේදය මෙරටට පැමිණියේ බුදු සමයත් සමඟය යන්න පිළිගත් විද්වත් මතයයි. නමුත් ඊට පෙර මෙරට ස්වදේශිකයන් අතරද දියුණු වෛද්‍ය ක්‍රමයක් පැවති බවට පුරාවෘත්ත හා ජනප්‍රවාද සාක්ෂි දරයි. බුදු සමයත්, භික්ෂු සමාජයත් පදනම් කරගෙන වෛද්‍ය ක්‍රමය ව්‍යාප්ත වූ බවත්, වෛද්‍ය ඥානය වර්ධනය වූ බවත් ඉතිහාසයෙන් පෙනේ.

මහනුවර යුගය වන විට ගුරු කුල පරම්පරාවලින් පෝෂිතව, දේශය පුරාම ව්‍යාප්ත භාවයකින් ද, සාමාන්‍ය ගැමියන් අතර පවා වූ විෂය මූල අවබෝධයකින් ද වෛද්‍ය ක්‍රමය හා වෛද්‍ය ඥානය පැවති බවට රොබට් නොක්ස් ආදීන්ගේ වාර්තාවලින් පැහැදිලි වේ. වෛද්‍ය ක්‍රම, නක්ශාස්ත්‍ර, ශාන්තිකර්ම යන අංගන්ගේ සාමූහිකත්වයකින් ද, සුවිශාල බෙහෙත් නිඝණ්ඩුවකින් ද, සොබාදහම පිළිබඳ ගැඹුරු විශ්වාසයකින් ද මෙම වෛද්‍ය ක්‍රමය පැවතිණි.

අධිරාජ්‍යවාදයත්, යටත්විජිතකරණයත් සමඟ අපේ පාරම්පරික වෙදකම පරිහානියටත් නොසැළකිල්ලටත් භාජනය විය. වෙදකම ගොඩේ වෙදකම ලෙසත්, වෛද්‍යවරයා ගොඩේ වෙදා ලෙසත්, පරිහාස මුඛයෙන් හැදින්විය. ජාතිකත්වය හා දේශීයත්වය ගර්හා කටයුතු නොවැදගත් දෙයක් බවට පත්විය.

1948 දී අපි නිදහස ලැබුව ද  ජාතික ප්‍රබෝධයකින් නැගී සිටීමට අවස්ථාව ලැබුණේ 1956 ජයග්‍රහණයත් සමඟයි. මේ වන විට ඇති වී ඇති වර්ධනය සුවිශාලය. වෛද්‍ය ඥානය විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා වර්ධනය වී ඇත. ප්‍රවීන වෘත්තිකයින් හා වෘත්තීය සංවිධාන වලින් ද ඖෂධ නිෂ්පාදනාගාරවලින් ද සමන්විත මෙය කැබිනට් අමාත්‍ය ධූරයක් දක්වා වූ ජාතික පිළිගැනීමකට ද ලක්ව ඇත. ආයුර්වේදය; ලංකායුර්වේදය නොහොත් පාරම්පරික වෙදකම සිද්ධ, යුනානි, හොමියෝපති ආදී වෛද්‍ය ක්‍රම රාශියකින් සමන්විතව දේශයේ සෞඛ්‍ය සංරක්ෂණයට දායක වෙමින් පවතී.

ආයුර්වේදය යනු ආයුෂ පිළිබඳ දැනුමයි. සුරක්ෂිත ජීවිතයකට මඟ හා දිගුකල් සතුටින් ජීවත්වීමේ රහස ආයුර්වේදයේ අඩංගු වේ. ගෝලීය අර්ථ ක්‍රමයෙන් හා ගෝලීය පරිභෝජන රටාවෙන් පීඩාවිදින ලෝකයට අද මේ වෛද්‍ය ක්‍රමය අත්‍යාවශ්‍ය වී ඇත. සුපිරි ලාභ පදනම් කරගත් නිෂ්පාදන ක්‍රියාවලියත්, එම ලාභ දෙගුණ තෙගුණකරන විද්‍යුත් මාධ්‍යත් මේ  තුළින් ගොඩනගන පරිභෝජන රටාවත් අද ලෝකයට මහත් වූ ව්‍යසනයක්ව ඇත. බෝ නොවන එහෙත් සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන රෝග රාශියකට මෙම පරිභෝජන රටාව හේතු කාරක වී ඇත. දිය වැඩියාව, හෘද රෝග, පිළිකා, රුධිර පීඩනය, වකුගඩු ආසාදනය, ස්ථූලභාවය ආදී රෝග රාශියක් පොදුවේ ලොව පුරාත්, සියලුම වයස් ව්‍යූහයන් අතරත් ව්‍යාප්ත වෙමින් පවතී. මෙම රෝග සඳහා වූ ප්‍රතිකාර විධිවලට ද සුවිශාල වියදමක් දැරීමට සිදුව ඇත. එනිසාම ස්වභාවික ප්‍රතිකාර ක්‍රම අඩංගු දියුණු ශිෂ්ඨාචාරයන් තුළින් පෝෂිත වූ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම පිළිබඳ ලොව බොහෝ විද්‍යාර්ථයින්ගේ අවධානය අද දැඩි ලෙස යොමු වෙමින් පවතී. අපේ දේශීය වෛද්‍ය ක්‍රම අද ඇත්තේ එවන් පසුබිමකය. ගෝලීය ධනවාදයත් එහි පරිභෝජන රටාවත් අතික්‍රමණය කළ හැකි අපේ වෛද්‍ය ක්‍රමය ගොඩනැගීමේ අභියෝගය අපට ඇත.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ආසියාවේ ආශ්චර්යමත් දේශයක් කරා මේ දේශය මෙහෙයවමින් සිටී. මහින්ද චින්තන වැඩසටහන යටතේ පරගැතිභාවය හා පරාධීන චින්තනය පිටුදකිමින් දේශීයත්වය හා ජාතිකත්වය මෝදුවෙමින් පවතින යුගයක අප සිටින්නෙමු.

නිරෝගී ජනතාවක් හා නිරෝගී ශ්‍රම බලකායක් තුළින් දේශයේ සෞඛ්‍ය සංරක්ෂණයේ පෙරගමන්කරුවා ලෙස නවීන විද්‍යා තාක්ෂණය උපයෝගී කරගත් දේශීය වෛද්‍ය ක්‍රමය ගොඩනැගීම දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ඒකායන පරමාර්ථයයි.

**සාලින්ද දිසානායක**
දේශීය වෛද්‍ය අමාත්‍ය

# ගරු දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය



ආයුර්වේදය හෙවත් ආයුෂ පිළිබඳ උගන්වන විද්‍යාව යන අර්ථයෙන් දේශීය වෛද්‍ය ක්‍රමයේ ඇති වටිනාකම ඕනෑම කෙනෙකුට අවබෝධ කර ගත හැකිය. අද වෙනදාටත් වඩා මිනිසා තම නිරෝගී ජීවන පැවැත්ම පිළිබඳව විශාල වශයෙන් උනන්දු වන බව නොරහසකි.

අතීතයේ අප රට තුළ පැරැන්නන් අනුගමනය කළ ජීවන රටාව තුළ නිරෝගීමත් ශක්තිමත් මිනිසුන් බිහිවූ බව දුටුගැමුණු යුගය වෙත ඉතිහාසය තුළින් සාක්ෂි ගෙන හැර පෑ හැකි වේ. එදා දස මහ යෝධයන් බිහි කළ අප මව්වරු පියවරු ගැන කතා කරන විට පෙනී යන්නේ එදා අප රට තුළ පැවති නිවැරදි දිවි පැවැත්මයි. සියලු භෝග වගාවන් අපටම ආවේණික වූ ක්‍රම අනුගමනය කරමින් අස්වැද්ද වූ අතර ඒවා පරිභෝජනය කළ ජනතාව නිරෝගී පරපුරක් බවට පත් විය. එපමණක් නොව, ආයුර්වේද ක්‍රමය ඉන්දියාවෙන් අප ලද වෛද්‍ය ක්‍රමයක් වුවද අපටම ආවේණික වූ පාරම්පරික වෛද්‍ය ක්‍රමයක් අප සතුව පැවති බව රාවණා යුගය දෙස බැලූ විට පෙනී යයි. එය දේශීය වෛද්‍ය ක්‍රමය නම් වේ.

යටත් විජිත පාලනයට නතුවූ අප, අපට හිමිව තිබූ සියලු අපේකම් අත් හැර දමා පරගැති මානසිකත්වයක් කර පින්නා ගැනීම හේතුවෙන් සියලු අපේකම් විනාශ වී ගොස් අද පවතින සියලු ව්‍යසනයන්ට භාජනය වීමට සිදු විය. එදා පැවති එම වටිනා ඇවතුම් පැවතුම් විනාශ කර දමා සෑම දෙයක්ම ක්ෂණිකව සිදු විය යුතු මානසිකත්වයක් ඇති කර ගැනීම හේතුවෙන් කය වෙහෙසා වැඩ කළ ජනතාව නිකමුන් පිරිසක් බවට පත් වීමත් සමඟම නොයෙකුත් ලෙඩ රෝග රාශියකට මඟ පාදා ගන්නා ලදී.

පිට රටින් ලැබෙන වස විස අනුභව කිරීමට පුරුදු වීම හේතුවෙන් අද සෑම අංශයකින්ම පිරිහුණු රෝගී පරපුරක් දැයට දායාද වෙමින් රටේ අනාගතයද අඳුරු යුගයකට පියනගමින් සිටින අවධියක දශක තුනක් පැවති කුරිරු බෙදුම්වාදී ත්‍රස්තවාදය අවසන් කළ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ නැවතත් අපේ කමට පණ පොවන යුගයක් අද උදා වෙමින් ඇත. එම හේතුව නිසා අද වෙනදාටත් වඩා ජනතාව තුළ විශාල පිබිදීමක් ඇති වෙමින් අපේ කමට නැවත ජනතාව පරිවර්තනය වෙමින් පවතී. මෙම ප්‍රවණතාවය අපේ රටට පමණක් නොව විදේශිකයන් පවා මවිතයට පත් කරවන්නක් බවට පත් වී ඇත. එහි විපුල ප්‍රයෝජන දේශීය වෙද කමටද අත්වීම හේතුවෙන් අප පංචකර්ම වෙදකම ඔස්සේ මෙරටට විදේශිකයන් ඇද ගැනීමට විශාල වශයෙන් මඟ පාදා ගැනීමට හැකි වී ඇත. එපමණක් නොව විදේශ සංචාරවලදී පවා මා ලැබූ අත්දැකීම් අනුව අපේ වෛද්‍ය ක්‍රමයට විශාල ඉල්ලුමක් ඇති බව පෙනී යයි. එම හේතුවෙන් ජපානය වැනි රටවල නුදුරු අනාගතයේදී දේශීය වෛද්‍යවරුන්ට පවා රැකියාවන් උදාකර දීමේ අවස්ථාවක් උදාවනු ඇත.

අපේ කම ඉදිරියට ගෙනයාමට හොඳම ක්‍රමය මෙම ආයුර්වේදීය ක්‍රමයයි. අතීතයේ සිටම එය පාරම්පරිකව පැවත ඒම නිසා එය තවදුරටත් නවීකරණය නොවී නොනැසී පැවතීම හේතුවෙන් මිනිසාගේ මනසට එය ලබා දීම පහසු කාර්යයක් බවට පත් වී ඇත. මෙම ක්‍රමය සමාජගත කිරීමට අද හොඳම ක්‍රමය වී ඇත්තේ පාසල් අධ්‍යාපනය තුළට මෙය අනුගත කිරීමයි. ඒතුළින් දරුවාද, දෙමව්පියන්ද දැනුවත් කිරීමට හැකි වීම හේතුවෙන් මෙම යහ පැවැත්මේ පණිවුඩය ඉතා ඉක්මණින්ම සමාජගත වනු ඇත.

තම ගෙවත්ත තුළ අලංකාරය සඳහා බොහෝ ඔසු උයන්, බෝග වගාවන් රෝපණය තුළින් ගතට මෙන්ම මනසටද නව ජීවයක් ඇති වී මිනිසා නිරෝගී පුද්ගලයන් බවට පත් වනු ඇත. වී ගොවිතැන සඳහාද කෘෂි රසායන ක්‍රම වෙනුවට අප පැරන්නන් අනුගමනය කළ වගා ක්‍රම වලට අනුගත වීම තුළින් වස විෂ වලින් තොර ආහාර නිෂ්පාදනයක් රට තුළ ඇති කර ගැනීමට හැකිවනවා මෙන්ම දීර්ඝායුෂ ඇති නිරෝගී පරපුරක් බිහි කිරීමටද හැකි වනවා ඇත.

මුළු ලොවම විශ්ව ගම්මානයක් බවට පත්වී ඇති අද වැනි යුගයක මිනිසාගේ යහ පැවැත්ම නැවත ඇති කිරීම විශ්ව කර්ම ක්‍රියාවලියක් නොවන බව මිනිසත් බව ලැබූ සෑම සියලු දෙනාම වටහා ගන්නේ නම්, නැවත මේ මුළු ලොවම මානව හිතවාදී තෝතැන්නක් බවට පත් කිරීමට සියලු ආගම් නායකයින්ගේ යහපත් ඉගැන්වීම් තුළින් මෙන්ම මිනිසාගේ යහපත් දිවිපැවැත්ම තුළින් හැකිවන බව නොඅනුමානය. එම නව ලොව ඉක්මණින්ම ආයුර්වේදය තුළින්ම බිහිවේවා යන්න මාගේ උතුම් ප්‍රාර්ථනාවයි.

**පණ්ඩු බණ්ඩාරනායක**
දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍ය

# ලේකම්තුමාගේ පණිවුඩය



ජීවිතය පිළිබඳ විද්‍යාව ලෙස හඳුන්වා දිය හැකි ආයුර්වේදය ඉපැරණි ශිෂ්ඨාචාරවල සිට අද දක්වා මිහිතලය මත වෙසෙන සියලු ජීවීන්ට ආරෝග්‍යය සලසන ශාස්ත්‍රයකි. මිනිසා කොතැනක, කවදා ලොව ජනිත වූයේද, හෙතෙම තම ජීවිකාව පවත්වා ගත්තේ ස්වභාව ධර්මයේ ආධාරයෙනි. නිරන්තරයෙන් සොබා දහම හා ගැටෙමින් දිවි ගෙවන අප සිරි ලක් වැසියෝද පුරාණයේ පටන් හුදෙක් පෝෂ්‍යදායී ආහාරපානාදිය උපයා ගැනීමට පමණක් නොව, තම රෝග පීඩාදියෙන් සුව පහසු වූයේද එහිම ආධාරයෙනි. ජීවක වෙදැඳුරුගේ නිල් මහනෙලක සුවඳට මුසු කළ ඖෂධයෙන් බුදු රජාණන් වහන්සේ සුවය ලද සේක. ඇත්, අස්, රිය පාබල සේනා හා දුනු හී රැගෙන, ගිනි අවි සමඟ යුධ වැදුනු පොරණ ලක්දිව රණකාමීහු ලද වණයෙන් සුවය ලද්දේ සොබා දම් දායාදයෙන් ලැබූ හෙළ ඔසුවෙනි. බුධදස් රජහු පශු වෛද්‍ය ශාස්ත්‍රෙයහි පරතෙර පැමිණියෝ නාගයෙකු සුවපත් කළාහ.

කාලයාගේ ඇවෑමෙන් විෂම භූගෝලීය කලාපයන් සමඟ පවත්වන්නට යෙදුණු අන්තර් සම්බන්ධතාවයන් සමඟ මෙම හෙළ ඔසු ශාස්ත්‍රය ඒ ඒ කලාපයට අදාළ ස්වභාවික ආරෝග්‍ය ශාස්ත්‍රයන් හා මුසුව පෝෂණය විය. ඉන්දියාවේ බිහිවූ සිද්ධායුර්වේද වෛද්‍ය ශාස්ත්‍රෙයනුත්, අරාබිකරයේ බිහිවූ යුනානි ශාස්ත්‍රෙයනුත්, අපරදිග හෝමියෝපති ශාස්ත්‍රයෙනුත් දේශීය වෛද්‍ය ක්‍රමය වර්තමානයේ පෝෂිතව ඇත.

දේශීය වෛද්‍ය ක්‍රම යටපත් වීමට හේතුවී තිබුණේ කාර්මික විප්ලවය මගින් ජීවන රටාව සංකීර්ණ කිරීමත්, අධිරාජ්‍යවාදී යටත්විජිත අර්ථක්‍රමයත් හේතුවෙනි. ගෝලීය වශයෙන් කාර්මීකරණය වීමේ අන්තරායකර අතුරු ප්‍රතිවිපාක විඳිත්ම, මනුෂ්‍ය ප්‍රජාව නැවතත් ස්වභාවික ආරෝග්‍ය ශාස්ත්‍රයට, දේශීය වෛද්‍ය ක්‍රමයට නැඹුරුවක් ඇතිවී තිබේ.

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් දේශීය වෛද්‍යක්‍රම වඩාවර්ධනය කරගැනීම පිණිස, හෙළ ඔසු හා එහි ගුණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, ඔසු වගා ව්‍යාපෘති මගින් ඖෂධ වගාව ප්‍රවර්ධනය කිරීම්, කොරියානු කටු චිකිත්සන ක්‍රම, යෝග විද්‍යා යනාදී බොහෝ නව අංශ කෙරෙහි අවධානය යොමුකර ඇත.

මෙම අමාත්‍යාංශයේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ පරපුරෙන් පරපුරට මෙම දේශීය වෛද්‍ය ශාස්ත්‍රය වඩාත් ගුණාත්මක භාවයකින් උරුමකර දීමයි. එය හුදෙක් ආර්ථික ප්‍රතිලාභයක් පමණක් නොව, සමාජයීය හා සංස්කෘතික සංවර්ධනයට පිටුවහලක් වන මහඟු කර්තව්‍යයකි.

එහෙයින් ආයුර්වේද දෙපාර්තමේන්තුව හා එහි උප ආයතනවල කටයුතුද සමඟ එක්ව, පාරම්පරික ඖෂධ ක්‍රමවේද හා ඔසු ශාස්ත්‍රඥානය රැක ගැනීමත්, එය අනාගත පරපුරට දායාද කිරීමත්, වඩාත් ගුණවත් සුව සේවාවක් උදෙසා ඔසු භාවිතය හා ප්‍රතිඵල පිළිබඳ නව පර්යේෂණ, සමීක්ෂණ දිරිමත් කිරීමත්, ජාත්‍යන්තර ප්‍රමිතිකරණ ක්‍රමවේදය අනුව හෙළ ඔසු ජාත්‍යන්තරයට විකාශනය කිරීමට නව ව්‍යාපෘති සකස්කර ක්‍රියාත්මක කරවීමත් සිදුකෙරෙයි.

වරින් වර වැනසී යළි නැගී එන උතුම් හෙළ වෙදකම් රැකුමට ශ්‍රී ලක් ජනපතිඳුන්ගේ මහින්ද චින්තන සහ එයට බැඳුනු ඉදිරි දැක්මෙන් පන්නරය ලැබ, හෙළ වෙදකම දිවයිනෙහි පමණක් නොව, නන් දෙස්හි ඔද පතුරුවා සිටිනු දසුන්ප්‍රිය බැවින් එහි උන්නතිය උදෙසා සැකසූ අයවැය වාර්තාව මෙයින් පිළිගන්වනු ලැබේ.

**ලලිත් කන්නන්ගර**
ලේකම්,
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

## දැක්ම

හෙල වෙදකමින් සැමට සුවසෙත

## මෙහෙවර

ශ්‍රී ලාංකීය අනන්‍යතාවය රැකෙන අයුරින්
පර්යේෂණ සහ
නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින්
සමස්ත ප්‍රජාවට
සුවසෙත සලසා මානව ශක්තීන් වර්ධනය
කිරීම තුලින් ඔවුන් ජාතික ආර්ථික
හා සහසු සංවර්ධන ඉලක්කයන්සපුරා ගැනීම
සඳහා ප්‍රබල අයුරින් දායක කරවීම.

# පෙළ ගැස්ම


| | |
|---|---|
| හැඳින්වීම | 8 |
| අමාත්‍යාංශ ප්‍රමුඛතා | 10 |
| සුවිශේෂී අරමුණු | 12 |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය | 24 |
| සංවිධාන ව්‍යුහය | 25 |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතන | 26 |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශය  යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති | 27 |
| ආයුර්වේද රෝගී සංඛ්‍යා ලේඛණ | 46 |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වියදම් වාර්තාව | 51 |

# 01.හැඳින්වීම

දේශීය වෛද්‍ය ක්‍රමයේ ඉතිහාසය සිංහල ජාතියේ ආරම්භය තරම්ම ඈතට දිව යන්නකි. ශ්‍රී ලංකාවට ආවේනික වූ පාරම්පරික වෛද්‍ය ක්‍රමයක් වන මෙය සම්ප්‍රදායික දැනුම මත පදනම් වූවකි. එමෙන්ම මෙය උතුරු ඉන්දියාවෙන් ලැබුණු ආයුර්වේදයත්, දකුණු ඉන්දියාවෙන් ලැබුණු සිද්ධ වෛද්‍ය ක්‍රමය හා අරාබිකරයේ යුනානි වෛද්‍ය ක්‍රමයත් සමඟ එක් වී පෝෂණය විය.

ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැවති අවධියේ දේශීය වෛද්‍ය ක්‍රමය යටපත් වී තිබූ අතර බටහිර වෛද්‍ය ක්‍රමය දේශය පුරා ව්‍යාප්ත වූයේ ජාතික සෞඛ්‍ය ක්‍රමයක් වශයෙනි.

නමුදු දේශීය වෛද්‍ය ක්‍රමයේ පවත්නා වූ ගුණාත්මක බව හඳුනාගත් රජයන් එය වර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියා කළ අතර වෙනම දෙපාර්තමේන්තුවක්, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පිහිටුවමින් මෙහි පැවැත්ම තහවුරු කරන ලදී. සෞඛ්‍ය අමාත්‍යාංශය සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ලෙස නම් කළ අතර, 1980 වසරේදී දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙනම අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිත කරන ලදී. වර්තමානයේ මෙය කැබිනට් ඇමතිවරයකුගේ හා නියෝජ්‍ය ඇමතිවරයකුගේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාම හෙළ වෙදකමේ උන්නතියට බලපාන කරුණකි. දේශීය වෙදකම තුළින් දේශයේ සංවර්ධනයට දායක කර ගත හැකි සෞඛ්‍ය සම්පන්න හා සමෘද්ධිමත් ජාතියක් බිහි කිරීම උදෙසා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සුවිශේෂී කාර්යය භාරයක් ඉටු කරනු ලබයි.

මේ වන විට ලංකාව පුරා දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රචලිතව පවතින අතර, බොහෝ දෙනා වැඩි වශයෙන් මෙම ප්‍රතිකාර ක්‍රමයට නැඹුරු වන බවක්ද දක්නට ලැබේ. එසේම ගුණාත්මක ඔසු නිෂ්පාදනය තුළින් අන් රට වලද දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීමට ලැබීම අප ලැබූ ජයග්‍රහණයකි. දේශීය වෛද්‍ය ක්‍රම ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම තුළින් ජනතාවට සෙත සැලසීම අමාත්‍යාංශයේ ප්‍රමුඛ අපේක්ෂාව වේ.

"**ලොවටම ආඩම්බරයෙන් දායාද කළ හැකි මහඟු දේශීය වෛද්‍ය ක්‍රමයක් අප සතුව ඇත. එම දැනුම සංරක්ෂණය කිරීමත් ලොවටම බෙදා හැරීමත් ඉතිහාසය විසින් මට පැවරුන වගකීමක් ලෙස මම දකිමි**" යන මහින්ද චින්තනයේ අපේක්ෂාව ඉටු කිරීමට පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

(1) සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩ නැගීම සඳහා දේශීය හා හෝමියෝපති වෛද්‍ය ක්‍රමය භාවිතා කිරීම.

(2) දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම.

(3) දේශීය ඔසු වගාව පුළුල් ලෙස ක්‍රියාත්මක කරමින් ඖෂධ නිෂ්පාදනය ඉහළ දැමීම.

(4) සුරක්ෂිත ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් ඇති කිරීම තුළින් සංචාරක කර්මාන්තය වැඩිදියුණු කර එය සංවර්ධනයට දායක කර ගැනීම.

(5) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ ප්‍රවර්ධනයක් ඇති කිරීම.

මේ වන විට දිවයින පුරා ආයුර්වේද රෝහල් 62ක් හා මධ්‍යම බෙහෙත් ශාලා 208ක් පිහිටුවා ඇති අතර ඒවායින් වසරකට රෝගීන් මිලියන 3ක් පමණද, නේවාසිකව රෝගීන් 25000 ක් පමණද ප්‍රතිකාර ගනු ලබයි.ආයුර්වේද වෛද්‍යවරුන් 1424 ක් දැනට රාජ්‍ය සේවයේ යොදවා ඇත. පළාත් පාලන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා 250 මඟින් රෝගීන්ට ප්‍රතිකාර ලබා දෙන අතර ඒවායේ පාලනය පළාත් පාලන ආයතන සතු වුවත් බෙහෙත් ලබා දීමේ වගකීම පැවරී තිබෙනුයේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට හා ආයුර්වේද දෙපාර්තමේන්තුවටය. සමස්ථයක් ලෙස ගත් කළ රටේ මුළු ජනගහණය වන මිලියන 20.87 න් 11% ක් පමණ රජයේ නිදහස් ආයුර්වේද සේවා ලබාගන්නා අතර, තවත් විශාල රෝගීන් සංඛ්‍යාවක් පෞද්ගලික ආයුර්වේද රෝහල් සහ බෙහෙත්ශාලා වලිනුත්, පාරම්පරික වෛද්‍යවරුන් වෙතිනුත් ප්‍රතිකාර ලබාගනී. 2011 වර්ෂයේදී හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ගැන විශ්වාසය තබා රජයේ හෝමියෝපති රෝහලට පැමිණි රෝගීන් සංඛ්‍යාව 24,011 කි.

දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා 2011.12.31 දින වන විට ආයුර්වේද වෛද්‍ය සභාවේ මුළු ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව 20353කි. උපාධිධාරීන්,ඩිප්ලෝමාධාරීන්, පාරම්පරික -සර්වාංග හා පාරම්පරික -විශේෂ යන වෛද්‍ය කාණ්ඩ සියල්ලම මීට ඇතුලත් වේ.

අපගේ සේවා දායකයින්ට ගුණාත්මක සේවාවක් ලබාදීම සඳහා පහත සඳහන් ආයතන ක්‍රියාත්මක වේ.

1. ආයුර්වේද දෙපාර්තමේන්තුව
2. ආයුර්වේද වෛද්‍ය සභාව
3. බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය
4. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය
5. ආයුර්වේද රෝහල් සහ මධ්‍යම බෙහෙත් ශාලා
6. ඔසු උයන්
7. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
8. හෝමියෝපති වෛද්‍ය සභාව
9. වැලිසර හොමියෝපති රෝහල සහ සායන
10. ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාලය-අනුරාධපුරය

# 02. අමාත්‍යාංශ ප්‍රමුඛතා

| විශේෂ අවධානයට ලක්වූ ප්‍රමුඛතා අංශ | ප්‍රතිඵල නිමැවුම් දර්ශකය |
|---|---|
| 1. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබද නීතිමය රාමුව සවිමත් කිරීම | ආයුර්වේද වෛද්‍ය ක්‍රම භාවිතයේ අක්‍රමිකතා අවම වීම.<br><br>වෘත්තීමය වශයෙන් තෘප්තිමත් ආයුර්වේද වෛද්‍යවරුන් බිහිවීම.<br><br>ආයුර්වේද ප්‍රතිකාර ආයතන නීතිමය පදනමක් මත ශක්තිමත් කිරීම. |
| 2. ආයුර්වේද පර්යේෂණ ශක්තිමත් කිරීම හා වැඩි දියුණු කිරීම | ගුණාත්මක භාවයෙන් යුත් නව ආයුර්වේද නිෂ්පාදනවල ප්‍රමාණාත්මක වැඩි වීම.<br><br>ආයුර්වේද පර්යේෂකයින්ගේ අයිතීන් තහවුරු වීම.<br><br>ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සම්බන්ධ පිළිගැනීම පුළුල් වීම.<br><br>ආයුර්වේද පර්යේෂණ හා පර්යේෂකයින් සදහා වැඩි අවස්ථාවන් සැළසීම.<br><br>සංරක්ෂණය වූ පාරම්පරික ආයුර්වේද ලේඛණ ප්‍රමාණය ඉහළ යාම.<br><br>ආයුර්වේදයට සම්බන්ධ බුද්ධිමය දේපල අයිතීන් සුරක්ෂිත වීම හා විධිමත් වීම. |
| 3. ආයුර්වේදය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම. | යාවත්කාලීන වූ තොරතුරු පද්ධතියක් නිර්මාණය වීම.<br><br>ක්‍රමවත් ජාලගත මෙහෙයුම් පද්ධතියක් නිර්මාණය වීම.<br><br>ඊ-ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් නිර්මාණය වීම.<br><br>දේශීය වෙදකමේ නිම් වලලු පුළුල් වීම . |
| 4. ආයුර්වේද සෞඛ්‍ය සංරක්ෂණය යාවත්කාලීන හා වැඩි දියුණු කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය | ගුණාත්මක භාවයෙන් යුත් මානව සම්පත ප්‍රමාණාත්මකව වැඩි වීම.<br><br>වෘත්තීමය වශයෙන් තෘප්තිමත් මානව සම්පත වැඩි වීම.<br><br>දේශීය වෛද්‍ය ක්‍රම සඳහා ඇති ගෝලීය ඉල්ලුම සැපිරිය හැකි වීම.<br><br>පාරම්පරික වෛද්‍යවරුන්ගේ දැනුම හා කුසලතාවය නූතන සමාජ අවශ්‍යතාවය උදෙසා යාවත්කාලීන වීම.<br><br>නිපුණතාවයෙන් යුත් දේශීය වෛද්‍යවරු ප්‍රමාණාත්මකව වැඩි වීම.<br><br>රාජ්‍ය හා පෞද්ගලික අංශවල ආයුර්වේද වෛද්‍ය ක්‍රම භාවිතාකරුවන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වැඩිදියුණු වී තිබීම. |

| | |
|---|---|
| 5.ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සහ ඖෂධීය පැළෑටි වගා කිරීම, වැඩිදියුණු කිරීම සහ ඔසු උයන් ආරම්භ කිරීම | ඉහළ ප්‍රමිතියෙන් යුතු ගුණාත්මක ඖෂධ ප්‍රමාණය වැඩිවීම.<br><br>ආයුර්වේදය තුළින් ආදායම් උත්පාදනය ඉහළ යාම.<br><br>ආයුර්වේද ඖෂධ සඳහා ඇති විදේශීය වෙළඳ පොළ අවස්ථා ඉහළ යාම.<br><br>භාවිතයට පහසු ඖෂධ නිෂ්පාදනය ඉහළ යාම. |
| 6.ආයුර්වේදය වාණිජකරණය අනුව පවත්වාගෙන යාම. | පාරම්පරික වෙදකම, ආයුර්වේද, සිද්ධ හා යුනානි වෛද්‍ය ක්‍රම ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත වීම.<br><br>විශේෂිත වූ ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම සැපයීමට හැකිවන පරිදි නවීන පහසුකම් සහිත රෝහල් ඇති වීම.<br><br>පවතින ඔසු උයන් හා නව ඔසු උයන් උසස් තත්වයට පත් වීම. |
| 7.හෝමියෝපති වෛද්‍ය ක්‍රම භාවිතය ඉහළ නැංවීම. | හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ආශ්‍රිත ආයතන විධිමත් ලෙස ස්ථාපිත වීම.<br><br>වෘත්තීමය වශයෙන් තෘප්තිමත් හෝමියෝපති මානව සම්පතක් ඇති වීම. |

සුවිශේෂී අරමුණු 01

**1.දේශීය වෛද්‍ය විෂයට අදාළව නීති හා රෙගුලාසි ප්‍රතිසංස්කරණය කිරීම**

| අරමුණු,ක්‍රමෝපායන් හා ක්‍රියාකාරකම් | | | කාල රාමුව | | | | | | | | | | වගකීම | කාර්ය සාධනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අරමුණු | ක්‍රමෝපාය | ක්‍රියාකාරකම් | පාදක වර්ෂය | 2013 | | | | 2014 | 2015 | 2016 | 2017 | ඉදිරියට ක්‍රියාත්මක වන. | | |
| | | | | Q1 | Q2 | Q3 | Q4 | | | | | | | |
| ආයුර්වේද නාමය භාවිත කරමින් කෙරෙන අක්‍රමිකතා ඉවත් කිරීම | පණත සංශෝධනය කිරීම. | පණත ක්‍රියාත්මක කිරීම. | 2011 | x | x | x | x | x | | | | | අති/ලේ සංවර්ධන<br>ආයු/කො<br>අධ්‍යක්ෂ සැලසුම්<br>පළාත් ආයු/කො | කෙටුම්පත් අවධිය |
| තෘප්තිමත් ආයුර්වේද වෛද්‍යවරුන් බිහිවීම | සේවා ව්‍යවස්ථාව සංශෝධනය | සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම. | 2011 | x | x | x | x | | | | | | අති/ලේ පාලන<br>ජ්‍යේ.ස.ලේ<br>ආයු/කො<br>පළාත් ආයු/කො | අනුමැතියට ඉදිරිපත් කර ඇත. |
| නීත්‍යානුකූලවූ පෞද්ගලික ආයුර්වේදීය ආයතනය ඇතිවීම | රෙගුලාසි සකස් කිරීම හා සංශෝධනය | රෙගුලාසි ක්‍රියාත්මක කිරීම. | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ සංවර්ධන<br>ආයු/කො<br>අධ්‍යක්ෂ සැලසුම්<br>පළාත් ආයු/කො | කෙටුම්පත් අවධිය |

සුවිශේෂී අරමුණු 02

## 2. ආයුර්වේද,සද්ධ,යුනානි වෛද්‍ය ක්‍රම ප්‍රවර්ධනය කිරීම

| අරමුණු , ක්‍රමෝපායන් හා ක්‍රියාකාරකම් | | | කාල රාමුව | | | | | | | | | | වගකීම | කාර්ය සාධනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අරමුණු | ක්‍රමෝපාය | ක්‍රියාකාරකම | පාදක වර්ෂය | 2013 | | | | 2014 | 2015 | 2016 | 2017 | ඉදිරියට ක්‍රියාත්මක වන.. | | |
| | | | | Q1 | Q2 | Q3 | Q4 | | | | | | | |
| නිධන්ගත රෝග සඳහා ප්‍රතිකාර ක්‍රම වැඩිදියුණු කිරීම. | භෞතික සම්පත් දියුණු කිරීම, වෛද්‍යවරුන්ගේකුසල තා වර්ධනය, පර්යේෂණ වැඩිදියුණු කිරීම නවීන තාක්ෂණය හඳුන්වා දීම. | ශික්ෂණ රෝහල් නව ගොඩනැගිලි ඉදි කිරීම. නවීන යන්ත්‍රසූත්‍ර හා උපකරණ සැපයීම. පුහුණුව සහ වෘත්තීය සුදුසුකම් වැඩිදියුණු කර ගැනීමට අවකාශ සැපයීම. | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ සංවර්ධන<br><br>ආයු/කො<br><br>අධ්‍යක්ෂ සැලසුම්<br><br>අධ්‍යක්ෂ රෝහල්<br><br>පළාත් ආයු/කො | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |
| බෝවන හා බෝ නොවන රෝගපාලනය | ප්‍රජා සෞඛ්‍යසේවා පුළුල් කිරීම. | පෝෂණ වැඩසටහන් දැනුවත් කිරීමේ වැඩසටහන් සායන | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ සංවර්ධන<br><br>ආයු/කො<br><br>අධ්‍යක්ෂ සැලසුම්<br><br>අධ්‍යක්ෂ ප්‍රජාසෙඛ්‍ය<br><br>පළාත් ආයු/කො | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සංරක්ෂිත<br>වූ<br>පාරම්පරි<br>ක<br>ආයුර්වේද<br>භාවිතාක<br>රුවන් බිහි<br>කිරීම. | පාරම්පරික<br>වෛද්‍යවරු<br>න්ට<br>පහසුකම්<br>වැඩිදියුණු<br>කිරීම.<br>කුසලතා<br>සංවර්ධනය<br>සංරක්ෂණ<br>සහා<br>ප්‍රවර්ධනය | හෙළවෙද<br>රැවනාර<br>විශ්‍රාම වැටුප්<br>පුස්කොල<br>පොත් හා<br>පැරණි<br>වට්ටෝරු<br>සුරක්ෂින<br>කිරීම | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ<br>සංවර්ධන<br><br>ආයු/කො<br><br>අධ්‍යක්ෂ<br>සැලසුම්<br><br>ලේඛකාධිකාරී<br>වෛද්‍ය<br>සභාව<br><br>පළාත්<br>ආයු/කො | අඛණ්ඩ<br>ඇගයීම හා<br>පසුවිපරම |

සුවිශේෂී අරමුණු 03

**3 ආයුර්වේද පර්යේෂණ වැඩිදියුණු කිරීම**

| අරමුණු , ක්‍රමෝපායන් හා ක්‍රියාකාරකම් | | | කාල රාමුව | | | | | | | | | | වගකීම | කාර්ය සාධනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අරමුණු | ක්‍රමෝපාය | ක්‍රියාකාරකම් | පාදක වර්ෂය | 2013 | | | | 2014 | 2015 | 2016 | 2017 | ඉදිරියට ක්‍රියාත්මක වන.. | | |
| | | | | Q1 | Q2 | Q3 | Q4 | | | | | | | |
| නිධන්ගත රෝග හා බෝවන රෝග සඳහා නව ආයුර්වේද ඖෂධ නිෂ්පාදන බිහිකිරීම. | පර්යේෂණායතනය ප්‍රතිව්‍යුහගත කිරීම. පර්යේෂකයින්ගේ දැනුම හා කුසලතාව වර්ධනය අවශ්‍ය පහසුකම් සැපයීම. | පර්යේෂණායතනය ස්වාධීන ආයතනයක් කිරීම. පර්යේෂකයින්ගේ පශ්චාත් උපාධි හා පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම. පර්යේෂණ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම. | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ සංවර්ධන<br>ආයු/කො<br>අධ්‍යක්ෂ සැලසුම්<br>අධ්‍යක්ෂ පර්යේෂණායතනය | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |
| ආයුර්වේද පර්යේෂණයන්ගේ අයිතිවාසිකම් සුරැකීම. | නීතිමය අවශ්‍යතා සංශෝධනය | බුද්ධිමය දේපළ අයිතිය ලබා දීම. පාරම්පරික දැනුම සුරක්ෂිත කිරීම සඳහා සංඛ්‍යාංක පුස්තකාල ක්‍රමය හඳුන්වා දීම.(Digital library) | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ සංවර්ධන<br>ආයු/කො<br>අධ්‍යක්ෂ සැලසුම්<br>අධ්‍යක්ෂ පර්යේෂණායතනය | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |

සුවිශේෂී අරමුණු 04

**4.ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය ඉහළ දැමීම සහ ඖෂධ වගාව වැඩි කිරීම**

| අරමුණු , ක්‍රමෝපායන් හා ක්‍රියාකාරකම් | | | කාල රාමුව | | | | | | | | | | වගකීම | කාර්ය සාධකය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අරමුණු | ක්‍රමෝපාය | ක්‍රියාකාරකම් | ආරම්භක වර්ෂය | 2013 | | | | 2014 | 2015 | 2016 | 2017 | ඉදිරියට ක්‍රියාත්මක වන | | |
| | | | | Q1 | Q2 | Q3 | Q4 | | | | | | | |
| ඖෂධීය පැළෑටි පිළිබඳ දැනුවත් වූ ප්‍රජාවක් බිහි කිරීම. | අදාල පාර්ශව දැනුවත් කිරීම හා ක්‍රියාකාර කම් සඳහා සහභාගී කරවීම. | පාසැල් ඔසු උයන් වැඩසටහන්, පන්සලෙන් ගමට වැඩසටහන, බන්ධනාගාර වැඩසටහන්, හමුදා කඳවුරු වැඩසටහන්, දිවි නැගුම වැඩසටහනට දායකත්වය ලබා දීම | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ සංවර්ධන<br><br>ආයු/කො<br><br>අධ්‍යක්ෂ සැලසුම්<br><br>අධ්‍යක්ෂ පර්යේෂණායතනය | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |
| පර්යේෂණ මඟින් ගුණාත්මක බවින් ඉහළ හා ප්‍රබල වූ ආයුර්වේද ඖෂධ නිපදවීම සඳහා ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ ඖෂධ පැළෑටි සුලභ කිරීම. | රාජ්‍ය පෞද්ගලි ක ඒකාබද්ධ වැඩසටහ න් ක්‍රියාත්ම ක කිරීම. නියමු ඖෂධ වගා ව්‍යාපෘති ප්‍රමිතිය වැඩිදියු ණු කිරීම. | ඔසු ගොවි සමාගම් තරුණ ඔසුගොවි වැඩසටහන් ගබඩාහා නිෂ්පාදනාගාර පහසුකම් වැඩිදියුණු කිරීම. රජය සතු ඔසු උයන් සංවර්ධනය ආයුර්වේද රෝහල් වල නිෂ්පාදන කටයුතු වර්ධනය | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ සංවර්ධන<br><br>ආයු/කො<br><br>අධ්‍යක්ෂ සැලසුම්<br><br>අධ්‍යක්ෂ පර්යේෂණායතනය<br><br>සභාපති ආයු/සංස්ථාව | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වගාකරුවන් හට ආදායම් වැඩි කිරීම | සංවිධානාත්මක වෙළඳ පොල ක්‍රමයක් හඳුන්වා දීම. | සංස්ථාව හා රෝහල් වල මිලදී ගැනීම් සම්බන්ධීකරණය<br>පළාත් මට්ටමින් මිලදී ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවීම<br>පෞද්ගලික අංශයේ සම්බන්ධීකරණය | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ සංවර්ධන<br><br>ආයු/කො<br><br>අධ්‍යක්ෂ සැලසුම්<br><br>අධ්‍යක්ෂ පර්යේෂණායතනය | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |

සුවිශේෂී අරමුණු 05

**5ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම සඳහා මානව සම්පත් වර්ධනය**

| අරමුණු , ක්‍රමෝපායන් හා ක්‍රියාකාරකම් | | | කාල රාමුව | | | | | | | | | | වගකීම | කාර්ය සාධනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අරමුණු | ක්‍රමෝපාය | ක්‍රියාකාරකම් | පාදක වර්ෂය | 2013 | | | | 2014 | 2015 | 2016 | 2017 | ඉදිරියට ක්‍රියාත්මක වන.. | | |
| | | | | Q1 | Q2 | Q3 | Q4 | | | | | | | |
| තෘප්තිමත් සේවක පිරිසක් ඇති කිරීම. | ප්‍රසන්න කාර්යයාලීය වටපිටාවක් සැපයීම.<br>සේවක අභිප්‍රේරණය | යටිතල පහසුකම් සැපයීම.<br>නව තාක්ෂණික මෙවලම් ලබා දීම.<br>ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>දක්ෂතා ඇගයීමට ලක්කිරීම.සේවකයින් සඳහා විධිමත් උසස් වීම් හා මාරු වීමේ ක්‍රමයක් හඳුන්වා දීම. | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ පාලන<br><br>ජේ.ස.ලේ<br><br>ආයු/කො<br><br>පළාත් ආයු/කො | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පාරම්පරික වෛද්‍ය වරැන්ගේ කුසලතා ,දැනුම තිරසාර සංවර්ධනය | පාම්පරික වෛද්‍යවරැන්ගේ,කළමණාකරණ ප්‍රජා සෞඛ්‍ය නිළධාරීන්ගේ හා ,පැලෑටි හා නිෂ්පාදන සම්බන්ධ නිළධාරීන්ගේ පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම. | පුහුණුව සඳහා යොමු කිරීම. උසස් අධ්‍යාපන පහසුකම් ලබා දීම. දැනුම් මට්ටම අනුව පිළිගත් සහතිකයක් ලබා දීම. | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ පාලන<br><br>ජේ.ස.ලේ<br><br>ආයු/කො<br><br>පළාත් ආයු/කො | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |
| ජනතාවට මනා සේවයක් සැපයීමට හැකි වෘත්තිකයින් පිරිසක් බිහි කිරීම. | නිපුණතා සපිරි වෘත්තිකයින් බඳවා ගැනීම,පුහුණුව හා සංවර්ධනය ආකල්ප වෙනස් කිරීම. | පුහුණුව සඳහා යොමු කිරීම. උසස් අධ්‍යාපන පහසුකම් ලබා දීම. දැනුම් මට්ටම අනුව පිළිගත් සහතිකයක් ලබා දීම. | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ පාලන<br><br>ජේ.ස.ලේ<br><br>ආයු/කො<br><br>පළාත් ආයු/කො | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |

සුවිශේෂී අරමුණු 06

## 6.තොරතුරු තාක්ෂණය ආයුර්වේදයට හඳුන්වා දීම

| අරමුණු , ක්‍රමෝපායන් හා ක්‍රියාකාරකම් | | | කාල රාමුව | | | | | | | | | | වගකීම | කාර්ය සාධනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අරමුණු | ක්‍රමෝපාය | ක්‍රියාකාරකම් | පාදක වර්ෂය | 2013 | | | | 2014 | 2015 | 2016 | 2017 | ඉදිරියට ක්‍රියාත්මක වන.. | | |
| | | | | Q1 | Q2 | Q3 | Q4 | | | | | | | |
| තොරතුරු තාක්ෂණය භාවිත කරමින් ජනතාව වෙත තොරතුරු සැපයීම. | වෙබ් අඩවිය . ඊ මේල් ,ෆේස් බුක් භාවිතය | වෙබ් අඩවිය යාවත්කාල කිරීම. ඊ-මේල් පණිවුඩ මගින් තොරතුරු ලබා දීම. වෛද්‍යවරුන් පිළිබඳ විස්තර අන්තර්ජාලයට එක් කිරීම. | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ සංවර්ධන<br><br>තොරතුරු තාක්ෂණ නිලධාරී | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |
| ඊ-හෙල්ත් පහසුකම | ඊ-චැනල් සේවය | අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ සංවර්ධන<br><br>තොරතුරු තාක්ෂණ නිලධාරී | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |

සුවිශේෂී අරමුණු 07

7.ආයුර්වේදය වාණිජකරණය කිරීම.

| අරමුණු , ක්‍රමෝපායන් හා ක්‍රියාකාරකම් | | | කාල රාමුව | | | | | | | | | | වගකීම | කාර්ය සාධනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අරමුණු | ක්‍රමෝපාය | ක්‍රියාකාරකම් | පාදක වර්ෂය | 2013 | | | | 2014 | 2015 | 2016 | 2017 | ඉදිරියට ක්‍රියාත්මක වන.. | | |
| | | | | Q1 | Q2 | Q3 | Q4 | | | | | | | |
| ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම. | සංචාරක ආකර්ශණය සඳහා මෙහෙයවීම.<br>රාජ්‍ය පෞද්ගලික ඒකාබද්ධ වාණිජ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>ආයුර්වේද නිෂ්පාදන හා අමුද්‍රව්‍ය වාණිජ මට්ටමින් දියුණු කිරීම.<br>ගුණාත්මක ආයුර්වේද සේවා සැපයීම. | ආයුර්වේද සංචාරක නිකේතන පිහිටුවීම.<br><br>සංචාරක හෝටල් ආශ්‍රිතව ආයුර්වේද සායන මධ්‍යස්ථාන සංවර්ධනය<br><br>ආයුර්වේද රෝහල් තුල ගෙවන වාට්ටු සංවර්ධනය<br><br>ආකර්ශණීය ඔසු උයන් ඇති කිරීම.<br><br>ආයුර්වේදය පිලිබඳ අධ්‍යයන හා පර්යේෂණ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම. | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ සංවර්ධන<br><br>ආයු/කො<br><br>අධ්‍යක්ෂ සැලසුම්<br><br>පළාත් ආයු/කො<br><br>අධ්‍යක්ෂ පර්යේෂණායතනය | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |

සුවිශේෂී අරමුණු 08


## 8.හෝමියෝපති වෛද්‍ය ක්‍රමය

| අරමුණු , ක්‍රමෝපායන් හා ක්‍රියාකාරකම් | | | කාල රාමුව | | | | | | | | | | වගකීම | කාර්ය සාධනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අරමුණු | ක්‍රමෝපාය | ක්‍රියාකාරකම් | පාදක වර්ෂය | 2013 | | | | 2014 | 2015 | 2016 | 2017 | ඉදිරියට ක්‍රියාත්මක වන.. | | |
| | | | | Q1 | Q2 | Q3 | Q4 | | | | | | | |
| හෝමියෝපති වෛද්‍යක්‍රමය ව්‍යාප්ත කිරීම | සුදුසුකම් ලත් වෛද්‍යවරු බිහි කිරීම. ආයතනික පහසුකම් වැඩිදියුණු කිරීම. | හෝමියෝපති වෛද්‍ය උපාධිය ලබා ගැනීම සඳහා ශිෂ්‍යත්ව ලබා දීම. සායන සංඛ්‍යාව වැඩි කිරීම. | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ සංවර්ධන<br>අති/ලේ පාලන<br>වෛද්‍ය සභාව<br>කා/හා/වෛ නිලධාරී | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |
| හෝමියෝපති ආයතන මනා ව ස්ථාපිත කිරීම. | වෛද්‍ය සභාව සවිබල ගැන්වීම. | ප්‍රතිව්‍යුහගත කිරීම. | 2011 | x | x | x | x | x | - | - | - | - | අති/ලේ සංවර්ධන<br>අති/ලේ පාලන<br>වෛද්‍ය සභාව<br>කා/හා/වෛ නිලධාරී | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |
| තෘප්තිමත් හෝමියෝපති මානව සම්පතක් ඇති කිරීම. | වෛද්‍යවරු හා කාර්යය මණ්ඩල සඳහා පුහුණුව | පුහුණු පාඨමාලා සංවිධානය උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීම. | 2011 | x | x | x | x | x | x | x | x | x | අති/ලේ සංවර්ධන<br>අති/ලේ පාලන<br>වෛද්‍ය සභාව<br>කා/හා/වෛ නිලධාරී | අඛණ්ඩ ඇගයීම හා පසුවිපරම |


## දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය - (2012-12-31 දිනට)

| තනතුර | අදාළ වන සේවය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. ලේකම් | - | 01 | 01 | - |
| 2. අතිරේක ලේකම්(පාලන) | SLAS (විශේෂ ශ්‍රේණිය) | 01 | 01 | - |
| 3. අතිරේක ලේකම්(සංවර්ධන) | SLAS (විශේෂ ශ්‍රේණිය) | 01 | 01 | - |
| 4. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන) | SLAS (1 පන්තිය) | 01 | 01 | - |
| 5. ප්‍ර ධාන ගණකාධිකාරී | SLAccS (1 පන්තිය) | 01 | 01 | - |
| 6. අධ්‍යක්ෂ (සංවර්ධන) | SLAS (1 පන්තිය) | 01 | 01 | - |
| 7. නියෝ. අධ්‍ය /සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | SLPS(II-II/II-I) | 01 | 01 | - |
| 8. නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | SLAS(III/LL) | 01 | 01 | 01 |
| 9. නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ(ශිල්ප වෛද්‍ය) | ආයුර්වේද වෛද්‍ය | 01 | 01 | - |
| 10. සහකාර ලේකම් (පාලන) | SLAS( III පංතිය) | 01 | - | 01 |
| 11. ගණකාධිකාරී | SLAccS(II-II/II-I) | 01 | 01 | - |
| 12. ගණකාධිකාරී(අභ්‍යන්තර විගණක) | SLAccS(II-II/II-I) | 01 | | 01 |
| 13. නීති නිළධාරී | | 01 | | 01 |
| 14. පරිපාලන නිලධාරී | රා.කළ.ස.සේ.(අධි) | 01 | 01 | - |
| 15. සංවර්ධන සහකාර | ආශ්‍රිත නිළධාරී | 11 | 11<br>අමාත්‍යාංශය - 04<br>යක්කල රෝහල - 01<br>දෙපා.පින්නදූව - 02<br>ප්‍ර.සෞ.ප්‍ර.සේ - 04 | |
| 16. සැපයුම් සහකාර | ආශ්‍රිත නිළධාරී | 02 | 02 | - |
| 17. සංඛ්‍යා ලේඛන සහකාර | ආශ්‍රිත නිළධාරී | 01 | 01 | - |
| 18. අයවැය සහකාර | ආශ්‍රිත නිළධාරී | 01 | - | 01 |
| 19. සංවර්ධන නිළධාරී | | 05 | 05(අභ්‍යාසලාභි) | - |
| 20. භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | 01 | - | 01 |
| 21. ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | - | 01 | 01 | - |
| 22. රාජ්‍ය කලමනාකරණ සහකාර | රා.ක.ස සේවය I/II/III | 22 | 20 | 02 |
| 23. කැමරා ක්‍රියාකරු(වීඩියෝ) | දෙපාර්තමේන්තුගත | 01 | 01 | - |
| 24. නිශ්චල ඡායාරූප ශිල්පී | දෙපාර්තමේන්තුගත | 01 | - | 01 |
| 25. කැමරා ක්‍රියාකරු (සහායක) | දෙපාර්තමේන්තුගත | 01 | 01 | - |
| 26. රියදුරු | රියදුරු සේවය | 16 | 14 | 02 |
| 27. කාර්යාල කාර්ය සහායක | කාර්යාල සේවක සේවය | 18 | 18 | - |
| 28. කම්කරු | දෙපාර්තමේන්තුගත | 01 | 01 | - |

# සංවිධාන ව්‍යුහය



# දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතන



# 04. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති.


## 4.1 අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන

ජනතාව දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ සෞඛ්‍ය තත්වය ඉහළ නංවා ජීවන තත්වය උසස් මට්ටමකට ගෙන ඒම අරමුණු කොට 2005 වර්ෂයේදී මෙම වැඩසටහන ආරම්භ කෙරිණ. ඒ අනුව වර්තමානයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22ක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන මෙහි පහත පරිදි නිලධාරීන් සේවයේ යොදවා ඇත.

| | |
|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 |
| ආයුර්වේද වෛද්‍ය නිලධාරි | 22 |
| ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන නිලධාරි | 210 |
| ලියාපදංචි ආයුර්වේද වෛද්‍යවරුන් | 84 |

### 2012 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ප්‍රගති වාර්තාව

| වැඩ සටහන | 2011 | 2012 |
|---|---|---|
| ස්වස්ථ සංරක්ෂණය (රෝග නිවාරණය) | 1,197 | 1,809 |
| ෂඩ් රසයයි,පෝෂණයයි | 1,319 | 1,739 |
| අසරිමත් පරිසරය අපේ ජීවයයි | 854 | 3,060 |
| ගෘහ ඒකක දැනුවත් කිරීම | - | 21,465 |
| මානසික හා අධ්‍යාත්මික ප්‍රවර්ධන වැඩසටහන | 63 | 61 |
| ප්‍රජා සත්කාරක වැඩසටහන් | 226 | 748 |
| ආයුර්වේද ප්‍රවර්ධන වැඩසටහන් | - | 248 |
| වෙනත් විශේෂ වැඩසටහන් | - | 559 |
| සායන සංඛ්‍යාව | 226 | 267 |
| රෝගීන් සංඛ්‍යාව | 8,067 | 12,121 |




| වැඩසටහන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල ඉදි කිරීම | 134634 |
| තරුණ ඔසු වගා ව්‍යාපෘතිය | 150 |
| ඔසු ගොවිපළ | සියලුම ආයුර්වේද රෝහල් සඳහා |
| ජංගම සායන පැවැත්වීම | 52800 |
| අවු 05 ට අඩු ළමුන්ගේ පෝෂණ තත්වය මැන බැලීමේ සමීක්ෂණය | 20000 |
| රාජ්‍ය නිළධාරීන්ගේ වෘත්තීය සෞඛ්‍ය රැකගැනීමේ වැඩසටහන | සියලුම රාජ්‍ය නිළධාරීන් |
| ගැබිණි මව දැයේ සම්පතයි විශේෂ වැඩසටහන | 13200 |
| ළමා සහ මාතෘ පෝෂණ වැඩසටහන | 10560 |
| කාබනික ගෙවතු වගාව | 1500 |
| දේශීය ආහාර ප්‍රචලිත කිරීමේ පෝෂණ වැඩසටහන් පැවැත්වීම | 50000 |
| ජනසහන සේවා වැඩසටහනේදී වෛද්‍ය සායන පැවැත්වීම | 11000 |
| වකුගඩු රෝගීන් පිළිබඳ සමීක්ෂණය | 2500 |
| ස්වස්ථ ප්‍රවර්ධන වැඩසටහන | 40000 |
| ආයුර්වේද සංකල්ප ක්‍රියාත්මක කිරීම | 26520 |
| වැඩිහිටි සත්කාර සේවා වැඩසටහන | 15000 |

2011 සිට 2012 දෙසැම්බර් 31 දක්වා මෙම ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය මෙමඟින් දක්වා ඇති අතර මෙහිදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ බහුලව දැකිය හැකි වකුගඩු රෝගය පිළිබඳව විශේෂ අවධානය යොමු කොට ඇත.මේ පිළිබඳව ආයුර්වේදය මඟින් පර්යේෂණයක් සිදු කොට ඇති අතර එහිදී සොයා ගැනුනු කරුණු පදනම් කර ගනිමින් දැනුවත් කිරීම් සහ සායන පවත්වා ඇත.වකුගඩු රෝගීන් සිටින පවුල් වලට මෙහිදී විශේෂ අවධානය යොමු කෙරේ.

## 4.2 තරුණ ඔසු ගොවි ගම්මාන වැඩසටහන



වර්තමානයේදී දේශීය අමුද්‍රව්‍ය,පවතින ඉල්ලුමට ප්‍රමාණවත් නොවන බැවින් ඒවා ඉන්දියාව,පකිස්ථානය වැනි රටවලින් ආනයනය කරනු ලබන අතර ඒ සඳහා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැයවේ.එසේම එම රටවල් අමුද්‍රව්‍ය ආනයනයන් සීමා කොට ඇති අතර එබැවින් වෙළෙඳපොලේ අමුද්‍රව්‍ය සපයා ගැනීම ගැටලුවක්ව පවතී.මෙයට විසඳුමක් ලෙස ඖෂධීය පැළෑටි වගා කිරීම සඳහා ද වැඩසටහනක් ලෙස මෙය ක්‍රියාත්මක වේ.ඒ මඟින් තරුණ තරුණියින් ඔසු වගාව සඳහා නැඹුරු කරවීමත්,ඔවුන්ට අතිරේක ආදායම් ඉපැයීමේ මාර්ගයක් ලඟා කර දීමත් අපේක්ෂා කෙරේ.

### 4.2.1 ව්‍යාපෘති මඟින් කෙරෙන ක්‍රියාකාරකම්.

- සාමාජිකයන් 5 දෙනා බැගින් ගොවීන් 50ක් සංවිධානය කිරීම.
- ඔසු වගාව පිළිබඳ අවශ්‍ය දැනුම සහ මඟ පෙන්වීම ලබා දෙන අතරේ කණ්ඩායම් ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධය ලබා දීම.
- එක් කණ්ඩායමකට රුපියල් 60,000ක මූල්‍ය පහසුකම් ප්‍රගතිය මත කොටස් වශයෙන් ලබා දීම.
- අඛණ්ඩ පසු විපරම් හා වෙළඳ පොළ අවස්ථා සලසා දීම.



# 4.3 පෝෂණ මන්දිර වැඩසටහන

මෙම වැඩසටහනෙහි මූලික අරමුණ වන්නේ දේශීය වෛද්‍ය ක්‍රමය උපයෝගී කර ගනිමින් ජනතාවගේ පෝෂණ තත්වය ඉහළ නැංවීමයි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පෝෂණ මන්දිර ඉදිකිරීම, කොළ කැඳ හා ඔසු පැන් කරත්ත බෙදා දීම යනාදියෙන් මෙම ඉලක්ක සපුරා ගැනේ. මේ වන විට කොළ කැඳ කරත්ත 16ක් බෙදා දී ඇති අතර 2012 දැයට කිරුළ වෙනුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා කොළ කැඳ කරත්ත 05ක් බෙදා දෙන ලදී.

තවද නාගදීපයේ පෝෂණ මන්දිරයක් දැනට ඉදිවෙමින් පවතින අතර අම්පාර දිස්ත්‍රික්කයේ පැවැත්වීමට නියමිත 2013 දැයට කිරුළ සඳහා කොළ කැඳ කරත්ත 5ක් ද බෙදා දීමට සැළසුම් කර ඇත.




## පෝෂණවැඩසටහන්






# 4.4 දේශීය ආහාර රටාව හා ආයුර්වේද ජීවන දර්ශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන.




නිරෝගී මෙන්ම දේශමාමක පරපුරක් ජාතියට උරුම කර දීමේ ශ්‍රේෂ්ඨ සංකල්පය පෙරදැරි කර ගනිමින් දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම, දේශීය ආහාර රටා හා සෞඛ්‍ය පුරුදු, අත් බෙහෙත් ක්‍රම හා ආහාර සැකසීමේදී අනුගමනය කරනු ලබන පෝෂණ ගුණය ඉහළ නැංවීමේ හා ආරක්ෂා කිරීමේ ක්‍රම ආදිය පහසුවෙන් ජීවිතවලට හුරු කර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන හා පෞද්ගලික අංශයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය කරන ලදී. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් මෙහි දෙවන වැඩ මුළුව 2012-10-18 දින කුරුණෑගල පළාත් සභා ශ්‍රවණාගාරයේදී පැවැත්වූ අතර, ඒ සඳහා 250කට අධික පිරිසක් සහභාගී විය.

දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය මගින් සංවිධානය කරන ලද මෙම වැඩමුළු සඳහා විවිධ ආයතන වලින් 600කට අධික පිරිසක් සහභාගී වූ අතර ඔවුන්ගේ ඉල්ලීම මත එම වැඩමුළු ඒ ඒ ආයතන මට්ටමින් ක්‍රියාත්මක කරමින් පවතී.



වැඩමුළු



# 4.5 හෙළ වෙද ගෙදර වැඩසටහන

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් රෝගීන්ට නේවාසිකව ආයුර්වේද ප්‍රතිකාර ලබා ගැනිමට අවස්ථාව උදාකර දීමේ අරමුණින් පාරම්පරික වෛද්‍යවරුන් හට වෙද මැදුරු ඉදි කිරීම සඳහා සහාය ලබා දෙන වැඩසටහනකි. මෙම වෙද මැදුරක් ඇඳන් 10කින් සමන්විතය. එසේම මෙම එක් වෙද මැදුරක් සඳහා මිලියන 1.2ක මුදලක් අමාත්‍යාංශය මඟින් දරණ අතර ඉතිරිය වෛද්‍යවරයා විසින් දැරිය යුතුය. 2004 වසරේ සිට ක්‍රියාත්මක වන මෙමඟින් දැනට දිස්ත්‍රික්ක 14ක් පුරා හෙළ වෙද ගෙවල් 38ක් ඉදි කොට ඇත. මේ අතරින් වැඩිම සංඛ්‍යාව වන හෙළ වෙද ගෙවල් 8 පිහිටුවා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේය.





**මාතර තිහගොඩ හෙළ වෙද ගෙදර විවෘත කිරීම**

# 05. අන්තර් අමාත්‍යාංශ සහයෝගීතා වැඩසටහන්

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය තවත් අමාත්‍යාංශ ගණනාවක් සමඟ ඒකාබද්ධව වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

- හමුදා අභිමංසල සමඟ හෙළ වෙද පියස වැඩසටහන
- ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ "පන්සලෙන් - ගමට" වැඩසටහන
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමඟ "දිවි නැගුම" වැඩසටහනට සහාය විය
- පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමඟ ඔසු වගාව වැඩසටහන
- අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ "පාසල් ඔසු උයන්" වැඩසටහන
- සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාශය සමඟ ආදිවාසීන්ගේ වෙදකම ,සංරක්ෂණය හා ඔසු වගාව වැඩසටහන
- ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය සමඟ "හෙළ වෙද පියස" වැඩසටහන
- **දැයට කිරුළ** ජාතික සංවර්ධන වැඩසටහන
- **එක්ස්පෝ 2011** ආයුර්වේද ජාත්‍යන්තර ප්‍රදර්ශනය

## 5.1 පූජනීය ස්ථාන වල ඔසු උයන් ඇරඹීම.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පූජනීය ස්ථාන වල ඔසු වගා වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙමින් බීජ හා පැළ ලබා දීමද අමාත්‍යාංශය මඟින් කරනු ලැබේ. ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන් සහ ප්‍රජා සෞඛ්‍ය සහායකයින් මඟින් මෙය ක්‍රියාත්මක කෙරෙන අතර, පූජනීය ස්ථාන 4,500ක් දැනට තෝරා ගෙන ඇත.

දේශීය ආහාර රටාවන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම, ඖෂධීය වටිනාකමින් යුතු එළවළු, පළතුරු පරිභෝජනයට ගැනීම තුළින් ඔවුන්ගේ පෝෂණ තත්වය ඉහළ දැමීම සඳහා කටයුතු කිරිම පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන්ගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ. මෙයද දිවි නැගුම යටතේ ක්‍රියාත්මක වන ගෙවතු වගා වැඩ සටහනේ ප්‍රතිඵලයකි.

දිවි නැගුමේ තවත් කාර්යයක් වන්නේ ජනතාව දේශීය ඖෂධ වගාවන් කෙරෙහි නැඹුරු කරවීමයි.
ඔවුන්ට අමතර ආදායම් මාර්ගයක් උපයා ගැනීමට අවස්ථාව සැළසෙන අතර ආර්ථික වටිනාකමින් යුත් හොඳ තත්වයේ ඖෂධ අමුද්‍රව්‍ය නිපදවා ගත හැකි වේ. ඒ තුළින් ඖෂධ අමුද්‍රව්‍ය ආනයනය සඳහා වැය වන විදේශ විනිමය ප්‍රමාණය අඩු කර ගත හැකි වේ.





මාතර කඹුරුපිටියේ පැවැත්වූ පන්සල් සඳහා ඖසුපැල බෙදා දීමේ වැඩසටහන

## 5.2 පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමඟ පවත්වන වැඩසටහන්.

බන්ධනාගාර අමාත්‍යාංශය සමඟ එක්ව එළිමහන් කඳවුරු වල ඖසු උයන් අරඹා ඇති අතර, ඒවා අලෙවිය සඳහාද මේ වන විට සැළසුම් කර ඇත.

මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවීන් 10 දෙනෙකු තෝරා ගෙන ඇති අතර ඔවුන් එළබටු වගා කරයි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන්නේ පුනරුත්ථාපන අධිකාරිය සමඟ ඒකාබද්ධවයි.



දිවි නැගුම යටතේ ක්‍රියාත්මක වන ගෙවතු වගා වැඩසටහන් නිපදවන එළවළු,පළතුරු අතුරින් ඖෂධීය ගුණයෙන් යුත් දේශීය ආයුර්වේද ආහාර රටාවන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම තුළින් ජනතාවගේ පෝෂණ තත්වය ඉහළ දැමීම පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන්ගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

ආර්ථිකමය වටිනාකමක් ඇති ඖෂධ වගාව සඳහා ජනතාව පෙළඹවීම තුළින් ඔවුනට ආදායම් මාර්ගයන් සළසා දීමත් ඒ මඟින් හොඳ තත්වයේ ඖෂධ අමුද්‍රව්‍ය නිපදවීමත් අදහස් කෙරේ.එසේම අමුද්‍රව්‍ය ආනයනය සඳහා වැය වන විදේශ විනිමය ප්‍රමාණය අඩු කර ගැනීමටද හැකිවේ.

## 5.3 අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වැඩසටහන් (පාසල් ඖෂධ උයන්)



අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව ක්‍රියාත්මක කරනු ලබන මෙහි ප්‍රධාන අරමුණ වන්නේ පාසල් සිසුන්ට ඖෂධ පැළ හඳුන්වා දීම, පාසල තුළත් ගෙවත්ත තුළත් ඖෂධ පැළ සංරක්ෂණය කිරීමට ඔවුන් පෙළඹවීම, ඖෂධීය පැළෑටි වල පවත්නා ඖෂධීය ගුණය පිළිබඳව පාසල් සිසුන්ට මූලික අවබෝධයක් ලබා දීම හා සිසුන් 1,000කට වැඩි සෑම පාසලකම ඖෂධ උයනක් ස්ථාපිත කිරීම යන කරුණුය.

මේ අනුව සබරගමු පළාතේ **සිසු ඖෂධ අරණ** වැඩසටහන යටතේ පාසල් ඖෂධ උයන් 28ක් පිහිටුවීමට සංවිධානය කර ඇත. මේ යටතේ පාසල් පුස්තකාල වෙත ලබාදීම සඳහා ඖෂධීය ශාක සංග්‍රහ පොත් කට්ටල ලබා දීමටද කටයුතු කරගෙන යනු ලබයි.

තවද අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන **විකිරි ඖෂධ උයන්** වැඩසටහනද ඉතාම ජනප්‍රිය වෙමින් පවතී. පාසල් මට්ටමින් ආරම්භ කරන ඖෂධ උයන් දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටම දක්වා ගෙන එමින් තරඟ පවත්වා ජයග්‍රාහකයින්ට ත්‍යාග හා සහතික පත්‍ර බෙදා දීම ගරු දේශීය වෛද්‍ය අමාත්‍ය සාලින්ද දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු විය.

මේ වන විට පාසල් 1000 කට වැඩි ප්‍රමාණයක පාසල් ඖෂධ උයන් ආරම්භ කොට ඇත.



පාසැල් ඖෂධ උයන්



## 5.4 සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වැඩසටහන්



මේ යටතේ පාරම්පරික වෛද්‍ය ක්‍රම සංරක්ෂණයට හා ප්‍රවර්ධනයට ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන අතර ආදිවාසීන්ට ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස කටුවැල් බටු හා එළ බටු වගාව හඳුන්වා දි ඇත. ඒ අනුව දඹාන ප්‍රදේශයේ මෙන්ම නිල්ගල, රතුගල ආදිවාසි ජනතාවද මෙම වගාව කරගෙන යනු ලබයි.දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආදිවාසී ජන සංස්කෘතිය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජාතික උරුමයන් පිළිබද අමාත්‍යාංශයේ මූල්‍යමය අනුග්‍රහයෙන් ඉදි කරන ලද දඹාන ආදිවාසී වෙද පියස, වැදි නායක ඌරුවරිගේ වන්නියල ඇත්තන්ගේ ආරාධනයෙන් 2012 ජුනි මස 22 වන දින දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු සාලින්ද දිසානායක මැතිතුමා විසින් විවෘත කරන ලදී.ආදිවාසීන්ට ඖෂධ සපයා ගැනීමේ අරමුණින් ඉදි කරන ලද මෙම වෙද පියසට අවශ්‍ය සියලුම ඖෂධ සපයනු ලබන්නේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟිනි.





දඹානේ ඔසු වගාව හා වෛද්‍ය ක්‍රම සංරක්ෂණය

## ජීවක හමුව රූපවාහිනී වැඩසටහන

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් ජනතාව දැනුවත් කිරීමේ කාර්ය සඳහා යොදා ගනු ලබන උපාය මාර්ග අතර තවත් එක් උපාය මාර්ගයක් වනයේ ස්වාධීන රූපවාහිනී සේවයේ සහයෝගය ඇතිව සතියේ සෑම සඳුදා දිනකම පෙ.ව. 11.30 විකාශය කරනු ලබන **ජීවක හමුව** වැඩ සටහන තුළින් ප්‍රවීණ ආයුර්වේද වෛද්‍යවරයකු සහභාගි කරවා ඖෂධ පැළෑටි, ආහාර රටාව හා සමාජයේ පවත්නා යම් යම් රෝග පිළිබඳ විශේෂ සාකච්ඡා මෙහෙයවමින් ජනතාව දැනුවත් කිරීමයි. මේ සඳහා මේ වන විට ආයුර්වේද වෛද්‍යවරු 36 දෙනකු පමණ සහභාගි කරවා ඇත.




# 6. දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ පිවිසුම

ජනතාව අතර ආයුර්වේදය පිළිබඳ දැනුම අවබෝධය හා ජීවන රටාවේ යහපත් හුරු පුරුදු ඇති කිරීමේ අරමුණින් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය නව සංදිස්ථානයක් පසු කරමින් අමාත්‍යාංශය තුළ තොරතුරු තාක්ෂණ ඒකකයක් ස්ථාපිත කරන ලදි. මේ අනුව ප්‍රථමයෙන් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සඳහා ත්‍රෛභාෂික වෙබ් අඩවියක් www.indigenousmedimine.gov.lk නමින් ශ්‍රී ලංකා ටෙලිකොම් ජාතික දුරකථන නාමාවලිය නිර්මාණය කරන රේන්බෝ ආයතනයේ සහභාගීත්වයෙන් නිර්මාණය කර 2011.09.26 දින අන්තර්ජාල ගත කරන ලදී.

තවද ඖෂධ පැළෑටි හා ආහාර රටාව පිළිබඳ තොරතුරු රැගත් ඊ පත්‍රිකා පෙළක් ඕනෑම කෙනෙකුට බලා ගත හැකි වන පරිදි ත්‍රෛභාෂික වෙබ් අඩවිය ඔස්සේ අන්තර්ජාල කර ඇත.

**"ජාතික ව්‍යාපාරික නාමාවලිය දේශීය ආයුර්වේදීය ප්‍රවර්ධනයට එක්වෙයි"** දේශිය වෛද්‍ය ක්‍රමය පිළිබඳව ලොව බොහෝ විද්‍යාර්ථීන්ගේ අවධානය යොමුව තිබෙන සුවිශේෂී අඅවස්ථාවක ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හා SLT රෙන්බෝ පේජස් ආයතනය එක්ව දේශීය වෙදකම 2012 වර්ෂයේ සිය සන්නිවේදන පාඨය ලෙස තෝරා ගෙන ඇති අතර එහි සන්නිවේදන ජාලය තුළ ලක්ෂ සංඛ්‍යාත




ප්‍රේක්ෂකයින් හට වර්ෂය පුරා නිරතුරුව ප්‍රචාරය කිරීමට සැලසුම් කර තිබීම ජාත්‍යන්තරය ජය ගැනීමට උදාවූ අනර්ඝ අවස්ථාවකි.

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය තුළ ස්ථාපිත කෙරුණු තොරතුරු තාක්ෂණ ඒකකය මඟින් දින පතා කරනු ලබන තවත් සුවිශේෂී කාර්යයක් වනුයේ ඖෂධ පැළෑටි, ආයුර්වේදීය ආහාර රටාව හා එදිනෙදා ජීවිතයට අදාළ අත් බෙහෙත් ආදී තොරතුරු ඇතුළත් ඉතා ආකර්ෂණීය ඊ මේල් පණිවුඩ සේවාවක් ආරම්භ කිරීමයි. ඊ මේල් භාවිතා කරන රාජ්‍ය නිළධාරීන් 6,000කට අධික පිරිසක් සඳහා මෙය සන්නිවේදනය වේ. මෙම සේවාවේ විශේෂත්වය වන්නේ මුද්‍රණය හා බෙදා හැරීම සඳහා කිසිඳු මුදලක් දැරීමට සිදුනොවීමයි.

## එමෙන්ම 2012 ශ්‍රී ලංකා ජාතික දුරකථන නාමාවලිය ආයුර්වේද තොරතුරු ඇතුළත්ව නිර්මාණය කර ඇත.









# 07. දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන

2012 දැයට කිරුළ අනුරාධපුර **ඔයාමඩුව** කේන්ද්‍ර කර ගනිමින් 2012-02-04 දක්වා පැවැත්වූ අතර ඊට සමගාමීව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාශියකි.

මෙහිදී දේශීය වෛද්‍ය අමාත්‍යාංශය නියෝජනය කරමින් ප්‍රදර්ශන කුටි 7ක් නිර්මාණය කෙරිණ.

- ඖසු පැළ පිළිබඳ ආයුර්වේද ප්‍රදර්ශන කුටිය
- පාරම්පරික වෛද්‍ය ක්‍රම පිළිබඳ ප්‍රදර්ශන කුටිය
- ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ඒකකය
- ගැමි ගෙදර
- පංචකර්ම ප්‍රදර්ශන කුටිය
- දේශීය ආහාර පිළිබද ප්‍රදර්ශන කුටිය
- ඖෂධ පැළ හා ආයුර්වේද ග්‍රන්ථ අලෙවි කුටිය



## 2012 වසරේ ක්‍රියාත්මක වූ වැඩසටහන් පහත දැක්වේ.

| වැඩ සටහන | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|
| 1. ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල ඉදි කිරීම | පදවිය, මැදවච්චිය, කැබිතිගොල්ලෑව, මිහින්තලය,හොරොව්පතාන |
| 2. තරුණ ඔසු ගොවි ගම්මාන වැඩසටහන | මධ්‍යම නුවරගම් පළාත, මැදවච්චිය, හොරොව්පතාන |
| 3. දේශීය පාරම්පරික වී වගාව | පදවිය |
| 4. ජංගම සායන පැවැත්වීම | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 |
| 5. අවුරුදු 5ට අඩු ළමුන්ගේ පෝෂණ තත්වය මැන බැලීමේ සමීක්ෂණය | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 |
| 6. රාජ්‍ය නිලධාරීන්ගේ වෘත්තීය සෞඛ්‍ය රැක ගැනීමේ වැඩසටහන | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 |
| 7. "ගැබිණි මව දැයේ සම්පතයි"විශේෂ වැඩසටහන | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 |
| 8. ළමා සහ මාතෘ පෝෂණ වැඩසටහන | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 |

| | |
|---|---|
| 9. කාබනික ගෙවතු වගාව | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 |
| 10. ඖසු උයන් පිහිටුවීම | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 |
| 11. දේශීය ආහාර ප්‍රචලිත කිරීමේ පෝෂණ වැඩමුළු පැවැත්වීම | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 |
| 12. ජන සහන සේවා වැඩසටහනේදී වෛද්‍ය සායන පැවැත්වීම | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 |
| 13. වකුගඩු රෝගීන් පිළිබද සමීක්ෂණය | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්රාදේශීය ලේකම් කොට්ඨාශ 22 |
| 14. ස්වස්ථ ප්‍රවර්ධන වැඩසටහන | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 |
| 15. ආයුර්වේද සංකල්ප ක්‍රියාත්මක කිරීම | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 |
| 16. වැඩිහිටි සත්කාර සේවා වැඩසටහන | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 |

**මෙම වැඩසටහනට සමගාමීව 2012 දැයට කිරුළ වෙනුවෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාශියකි.**

1. පාසල් ඖසු උයන් ඇති කිරීම

2. පාසල් ළමුන් සඳහා පෝෂණ වැඩසටහන්

3. හෙළ වෙද ගෙදර

4. පෝෂණ මන්දිර

5. කොළ කැඳ කරත්ත

6. හමුදා කඳවුරු තුළ ඖසු වගාව

7. දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ ඖසු උයන අක්කර 02

8. දැයට කිරුළ නරඹන්නන්ට නොමිලේ ඖසු පැන් සැපයීම

# ආයුර්වේද දෙපාර්තමේන්තුව

- ආයුර්වේද වෛද්‍ය සභාව
- දේශීය වෛද්‍ය ක්‍රම පිලිබඳ ජාතික ආයතනය
- ආයුර්වේද රෝහල්

ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ශික්ෂණ සහ පර්යේෂණ රෝහල් 07 ක් ඇත.

- බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල
- කයිතඩි සිද්ධායුර්වේද ආයුර්වේද ශික්ෂණ රෝහල
- ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල
- ආයුර්වේද පර්යේෂණ රෝහල - නාවින්න
- ආයුර්වේද පර්යේෂණ රෝහල - හම්බන්තොට
- ආයුර්වේද පර්යේෂණ රෝහල - මන්වන්තුඩායි
- ආයුර්වේද පර්යේෂණ රෝහල - අම්පාර







නාවින්න පර්යේෂණ රෝහලේ බාහිර රෝගී අංශය

පර්යේෂණ ඔසු උයන්

- නාවින්න
- ගිරාඳුරුකෝට්ටේ
- පල්ලෙකැලේ
- බත්ගොඩ
- පට්ටිපොල
- පින්නදූව






- හෝමියෝපති රෝහල-වැලිසර
- ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
- ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය

## දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ආයුර්වේද කටයුතු කරන අනෙකුත් ආයතන


| පරිපාලන ඒකකය | ආයුර්වේද රෝහල් | ආයු. මධ්‍යම බෙහෙත් ශාලාව |
|---|---|---|
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත | 9 | 16 |
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සබරගමුව පළාත | 9 | 10 |
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව ඌව පළාත | 3 | 20 |
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව මධ්‍යම පළාත | 9 | 21 |
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව උතුරු මැද පළාත | 7 | 30 |
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව නැගෙනහිර පළාත | 5 | 40 |
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව උතුරු පළාත | 6 | 18 |
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 9 | 25 |

| | | |
|---|---|---|
| දකුණු පළාත | | |
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව වයඹ පළාත | 10 | 31 |
| මුළු එකතුව | 67 | 211 |

මෙයට අමතරව පලාත් පාලන ආයතන මගින් පාලනය වන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා 231 ක් දිවයින පුරා ක්‍රියාත්මක වනු ලැබේ.

**<u>ආයුර්වේද වෛද්‍ය සභාව යටතේ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් 2012 දෙසැම්බර් 31 දිනට</u>**

| වෛද්‍ය කාණ්ඩය | ලියාපදිංචි ප්‍රමාණය |
|---|---|
| උපාධිධාරීන් | 2109 |
| ඩිප්ලෝමාධාරීන් | 5024 |
| විශේෂ රෝග සඳහා පාරම්පරික වෛද්‍යවරු | 8239 |
| සාමාන්‍ය රෝග සඳහා පාරම්පරික වෛද්‍යවරු | 5340 |
| මුළු ලියාපදිංචි වෛද්‍යවරු සංඛ්‍යාව | 20712 |




# මධ්‍යම රජයට අයත් ආයුර්වේද රෝහල් වල සංඛ්‍යා ලේඛණ- 2012

| | පලාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | ආයතනයන් විවෘතව තිබූ දින ගණන | පළමු පැමිණීම | නැවත පැමිණීම | එකතුව | සා.දෛනික පැමිණීම | බාහිර රෝගීන් සඳහා නිකුත් කළ ඖෂධ වල වටිනාකම(රු) | වාට්ටු ගණන | ඇඳන් ගණන | ඇතුළත් වූ@ රෝගීන් | පිටවූ රෝගීන් | නේවාසික රෝගීන්ට නිකුත් කළ ඖෂධ වල වටිනාකම(රු)') |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | දකුණු පළාත | 9378.5 | 238310 | 125080 | 363390 | 1271 | 21,529,193.00 | 23 | 435 | 3093 | 3071 | 3,373,303.90 |
| 2 | සබරගමුව පළාත | 5765 | 130670 | 137430 | 268100 | 924 | 22,764,057.00 | 28 | 458 | 4202 | 3865 | 6,188,324.00 |
| 3 | මධ්‍යම පළාත | 7612 | 169986 | 181918 | 351904 | 1290 | 22,044,799.91 | 20 | 486 | 4356 | 4253 | 5,412,919.13 |
| 4 | ඌව පළාත | 7299.5 | 140115 | 183730 | 323845 | 1064 | 28,233,137.93 | 15 | 248 | 1925 | 1786 | 3,487,413.88 |
| 5 | බස්නාහිර පළාත | 7346 | 543863 | 462774 | 1006637 | 3364 | 76,111,108.64 | 23 | 308 | 3279 | 3214 | 5,663,888.38 |
| 6 | නැගෙනහිර පළාත | 13872 | 168694 | 81485 | 250179 | 866 | 21,885,361.00 | 12 | 400 | 1854 | 1830 | 2,007,063.00 |
| 7 | උතුරු පළාත | 6144 | 95635 | 47808 | 143443 | 530 | 3,954,093.49 | 12 | 80 | 801 | 801 | 764.90 |
| 8 | වයඹ පළාත | 11734.5 | 167286 | 173976 | 341262 | 863 | 27,564,397.76 | 29 | 529 | 4729 | 4415 | 5,880,882.57 |
| 9 | උතුරු මැද පළාත | සංඛ්‍යා ලේඛණ වාර්තා ලැබී නොමැත | | | | | | | | | | |
| | **එකතුව** | 66640 | 1612456 | 1357476 | 2969932 | 10172.15 | 217,159,357.48 | 156 | 2874 | 23561 | 22653 | 31,264,810.69 |


# පළාත් ආයුර්වේද රෝහල් වල රෝගී සංඛ්‍යා ලේඛණ - 2012

| ආයතනය | දුරකථන අංකය | ආරම්භ කළ දිනය | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | බාහිර රෝගී සංඛ්‍යා ලේඛන | | | | | | නේවාසික රෝගී සංඛ්‍යා ලේඛන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ආයතනය න් විවෘත ව තිබූ දින ගණන | පළමු පැමිණීම | නැවත පැමිණීම | එකතුව | සා. දෛනික පැමිණීම | බාහිර රෝගීන් සඳහා නිකුත් කළ ඖෂධ වල වටිනාකම(රු) | වාට්ටු ගණන | ඇඳන් ගණන | ඇතුළත් වූ@ රෝගීන් | පිටවූ රෝගීන් | නේවාසික රෝගීන්ට නිකුත් කළ ඖෂධ වල වටිනාකම(රු') |
| ආයුර්වේද රෝහල- කයිතඩි | 021-2057104 | 1973.06. 29 | යාපනය | තන්මාරච්චි | 306 | 19,060 | 10,652 | 29,712 | 97 | 4,111,768.00 | 5 | 140 | 881 | 886 | 2,055,885.00 |
| ආයුර්වේද රෝහල- හම්බන්තොට | 047-2256700 | 2010.02. 13 | හම්බන්තොට | හම්බන්තොට | 283 | 11,868 | 17,355 | 29,223 | 103 | 4,511,115.00 | 2 | 55 | 277 | 226 | 665,040.00 |
| ආයුර්වේද රෝහල- යක්කල | 033-2227988 | 1984 ජුනි | ගම්පහ | ගම්පහ | 292 | 27,866 | 22,197 | 50,063 | 171 | 9,308,550.00 | 4 | 109 | 907 | 896 | 4,413,150.00 |
| ආයුර්වේද රෝහල- අම්පාර | 063-2224349 | 1990.01. 01 | අම්පාර | අම්පාර | 311 | 14,705 | 12,137 | 26,842 | 86 | 4,074,486.55 | 2 | 24 | 356 | 356 | 1,058,719.38 |
| ආයුර්වේද රෝහල- මන්චන්තුඩායි | 065-2247178 | 1993.11. 29 | ත්‍රිකුණාමලය | මන්මුනායි උතුර | 295 | 3,842 | 2,709 | 6,551 | 22 | 989,995.00 | 2 | 10 | | | |
| ආයුර්වේද රෝහල- බොරැල්ල | 0112-694637 | 1943 | කොළඹ | තිඹිරිගස්යාය | 335 | 109,216 | 63,547 | 172,763 | 516 | 33,498,638.25 | 13 | 170 | 1827 | 1816 | 7,148,665.90 |
| ආයුර්වේද රෝහල- | 0112-897287 | 1962.10. 14 | කොළඹ | මහරගම | 294 | 47,744 | 24,061 | 71,805 | 244 | 10,773,456.00 | 4 | 71 | 466 | 445 | 447,537.85 |
| එකතු< | | | | | 2116 | 234,301 | 152,658 | 386,959 | 1240 | 67,268,008.80 | 32 | 579 | 4714 | 4625 | 15,788,998.13 |

## මධ්‍යම රජයට අයත් ආයුර්වේද රෝහල් වල සංඛ්‍යා ලේඛණ- 2012





## පළාත් ආයුර්වේද රෝහල් වල රෝගී සංඛ්‍යා ලේඛණ - 2012



# හිසතෙල් ගෑමේ රාජ්‍ය උත්සවය

2012 සිංහල හින්දු අලුත් අවුරුදු හිස්තෙල් ගෑමේ රාජ්‍ය මහෝත්සවය 2012 අප්‍රේල් මස 15 වන සෙනසුරාදා පූර්ව භාග 7.41 ට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාතර “රන් දූපත “ ශ්‍රී රෝහන උපෝසථාගාර මහා විහාරයේදී පැවැත්විනි.මෙය දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ආයුර්වේද දෙපාර්තමේන්තුව එක්ව සංවිධානය කරනු ලබන ප්‍රධාන ජාතික උත්සවයකි.







හිසතෙල් ගෑමේ උත්සව භූමියට සපැමිණි අතිගරු ජනාධිපතිතුමන් පිළි ගනිමින්...

**දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

**2012 දෙසැම්බර් 31 දිනට වියදම් වාර්තාව**

| ප්‍රතිපාදන රු. | ප්‍රතිපාදන අහුරා තැබීම් | ශුද්ධ ප්‍රතිපාදන | 2012.12.31 දිනට මුළු වියදම | ඉතිරි ප්‍රතිපාදන | මුළු වියදම ප්‍රතිපාදන වල % ක් ලෙස | ඉතිරි ප්‍රතිපාදන මුළු ප්‍රතිපාදන වල % ක් ලෙස | වැය විෂය විස්තරය |
|---|---|---|---|---|---|---|---|
| 10,000,000.00 | | 10,000,000.00 | 9,057,075.46 | 942,924.54 | 90.57 | 9.43 | වැටුප් හා වේතන |
| 3,000,000.00 | | 3,000,000.00 | 2,758,483.68 | 241,516.32 | 91.95 | 8.05 | අතිකාල හා නිවාඩු දින වැටුප් |
| 4,900,000.00 | | 4,900,000.00 | 4,605,304.09 | 294,695.91 | 93.99 | 6.01 | වෙනත් දීමනා |
| 2,000,000.00 | | 2,000,000.00 | 1,910,755.72 | 89,244.28 | 95.54 | 4.46 | ගමන් වියදම් - දේශීය |
| 5,350,000.00 | | 5,350,000.00 | 4,555,712.98 | 794,287.02 | 85.15 | 14.85 | ගමන් වියදම් - විදේශීය |
| 1,000,000.00 | | 1,000,000.00 | 920,263.52 | 79,736.48 | 92.03 | 7.97 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා |
| 12,000,000.00 | | 12,000,000.00 | 9,490,897.53 | 2,509,102.47 | 79.09 | 20.91 | ඉන්ධන හා ලිහිසි තෙල් |
| 15,000.00 | | 15,000.00 | 4,960.00 | 10,040.00 | 33.07 | 66.93 | ආහාරපාන හා නිල ඇඳුම් |
| 1,250,000.00 | | 1,250,000.00 | 1,025,126.70 | 224,873.30 | 82.01 | 17.99 | වෙනත් සැපයීම් |
| 4,200,000.00 | | 4,200,000.00 | 3,970,647.96 | 229,352.04 | 94.54 | 5.46 | වාහන |
| 200,000.00 | | 200,000.00 | 197,290.76 | 2,709.24 | 98.65 | 1.35 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ |
| 75,000.00 | | 75,000.00 | 13,760.00 | 61,240.00 | 18.35 | 81.65 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් |
| 4,925,000.00 | | 4,925,000.00 | 3,390,400.00 | 1,534,600.00 | 68.84 | 31.16 | ප්‍රවාහන |
| 1,000,000.00 | | 1,000,000.00 | 803,036.77 | 196,963.23 | 80.30 | 19.70 | තැපැල් හා සන්නිවේදන |
| 2,000,000.00 | | 2,000,000.00 | 658,099.56 | 1,341,900.44 | 32.90 | 67.10 | විදුලිය හා ජලය |
| 100,000.00 | 100,000.00 | - | - | - | - | - | බදුකුලී හා පළාත් පාලන ආයතන බදු |
| 2,800,000.00 | | 2,800,000.00 | 1,615,542.69 | 1,184,457.31 | 57.70 | 42.30 | වෙනත් සේවා |
| 10,000.00 | 10,000.00 | - | - | - | - | - | රජයේ සේවකයින් සඳහා දේපල ණය පොළී |
| **54,825,000.00** | **110,000.00** | **54,715,000.00** | **44,977,357.42** | **9,737,642.58** | 82.20 | 17.80 | |
| 5,954,000.00 | | 5,954,000.00 | 1,867,217.53 | 4,086,782.47 | 31.36 | 68.64 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් |
| 600,000.00 | | 600,000.00 | 29,500.00 | 570,500.00 | 4.92 | 95.08 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ වැඩිදියුණු කිරීම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3,900,000.00 | | 3,900,000.00 | 3,561,796.98 | 338,203.02 | 91.33 | 8.67 | වාහන පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම |
| 20,000,000.00 | | 20,000,000.00 | 13,933,920.72 | 6,066,079.28 | 0.00 | 100.00 | වාහන අත්පත් කර ගැනීම |
| 971,000.00 | | 971,000.00 | 966,190.98 | 4,809.02 | 99.50 | 0.50 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ |
| 400,000.00 | | 400,000.00 | - | 400,000.00 | 0.00 | 100.00 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ |
| 400,000.00 | 400,000.00 | - | - | - | - | - | ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම |
| **32,225,000.00** | **400,000.00** | **31,825,000.00** | **20,358,626.21** | **11,466,373.79** | **63.97** | **36.03** | |
| **87,050,000.00** | **510,000.00** | **86,540,000.00** | **65,335,983.63** | **21,204,016.37** | **75.50** | **24.50** | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 19,150,000.00 | | 19,150,000.00 | 18,620,936.54 | 529,063.46 | 97.24 | 2.76 | වැටුප් හා වේතන |
| 1,700,000.00 | | 1,700,000.00 | 1,575,592.05 | 124,407.95 | 92.68 | 7.32 | අතිකාල හා නිවාඩු දින වැටුප් |
| 8,500,000.00 | | 8,500,000.00 | 8,492,077.40 | 7,922.60 | 99.91 | 0.09 | වෙනත් දීමනා |
| 800,000.00 | | 800,000.00 | 481,375.24 | 318,624.76 | 60.17 | 39.83 | ගමන් වියදම් - දේශීය |
| 2,000,000.00 | | 2,000,000.00 | 1,927,401.19 | 72,598.81 | 96.37 | 3.63 | ගමන් වියදම් - විදේශීය |
| 1,500,000.00 | | 1,500,000.00 | 1,416,448.56 | 83,551.44 | 94.43 | 5.57 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා |
| 3,500,000.00 | | 3,500,000.00 | 3,311,754.98 | 188,245.02 | 94.62 | 5.38 | ඉන්ධන හා ලිහිසි තෙල් |
| 150,000.00 | | 150,000.00 | 94,727.50 | 55,272.50 | 63.15 | 36.85 | ආහාරපාන හා නිල ඇඳුම් |
| 800,000.00 | | 800,000.00 | 640,504.19 | 159,495.81 | 80.06 | 19.94 | පුවත්පත් පොත් හා වෙනත් |
| 3,000,000.00 | | 3,000,000.00 | 2,680,987.64 | 319,012.36 | 89.37 | 10.63 | වාහන නඩත්තු වියදම් |
| 350,000.00 | | 350,000.00 | 310,091.93 | 39,908.07 | 88.60 | 11.40 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් |
| 150,000.00 | | 150,000.00 | 11,300.00 | 138,700.00 | 7.53 | 92.47 | ගොඩනැගිලි නඩත්තු වියදම් |
| 2,300,000.00 | 1,000,000.00 | 1,300,000.00 | 935,483.49 | 364,516.51 | 71.96 | 28.04 | ප්‍රවාහන හා කුලී ගාස්තු |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1,750,000.00 | | 1,750,000.00 | 1,656,090.09 | 93,909.91 | 94.63 | 5.37 | තැපැල් හා සන්නිවේදන |
| 2,500,000.00 | | 2,500,000.00 | 1,200,000.00 | 1,300,000.00 | 48.00 | 52.00 | විදුලිය හා ජලය |
| 100,000.00 | 100,000.00 | - | - | - | - | - | බදුකුලී හා පළාත් පාලන ආයතන බදු |
| 5,000,000.00 | | 5,000,000.00 | 352,903.06 | 4,647,096.94 | 7.06 | 92.94 | ආරක්ෂක සේවා |
| 600,000.00 | | 600,000.00 | 298,918.57 | 301,081.43 | 49.82 | 50.18 | සනීපාරක්ෂක සේවා |
| 650,000.00 | | 650,000.00 | 328,262.96 | 321,737.04 | 50.50 | 49.50 | සංග්‍රහ වියදම් |
| 500,000.00 | | 500,000.00 | 109,427.00 | 390,573.00 | 21.89 | 78.11 | කාර්ය මණ්ඩල පුහුණුව |
| **55,000,000.00** | **1,100,000.00** | **53,900,000.00** | **44,444,282.39** | **9,455,717.61** | 82.46 | **17.54** | |
| 16,800,000.00 | | 16,800,000.00 | 14,733,437.09 | 2,066,562.91 | 87.70 | 12.30 | හෝමියෝපති රෝහල |
| 6,000,000.00 | | 6,000,000.00 | 2,132,993.20 | 3,867,006.80 | 35.55 | 64.45 | වෙනත් සේවා |
| 6,600,000.00 | | 6,600,000.00 | 5,513,898.97 | 1,086,101.03 | 83.54 | 16.46 | හෝමියෝපති කවුන්සිලය |
| 2,050,000.00 | | 2,050,000.00 | 47,270.00 | 2,002,730.00 | 2.31 | 97.69 | පෝෂණ මන්දිරය පිහිටුවීම |
| 100,000.00 | 100,000.00 | - | - | - | - | - | සම්මාදම් දායක මුදල් හා සාමාජික මුදල් |
| 350,000.00 | | 350,000.00 | 297,936.15 | 52,063.85 | 85.12 | 14.88 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී |
| 48,902,000.00 | 2,427,000.00 | 46,475,000.00 | 41,906,166.31 | 4,568,833.69 | 90.17 | 9.83 | පළාත් සභා |
| **80,802,000.00** | **2,527,000.00** | **78,275,000.00** | **64,631,701.72** | **13,643,298.28** | **82.57** | **17.43** | |
| **135,802,000.00** | **3,627,000.00** | **132,175,000.00** | **109,075,984.11** | **23,099,015.89** | **82.52** | **17.48** | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3,500,000.00 | 500,000.00 | 3,000,000.00 | 263,130.48 | 2,736,869.52 | 8.77 | 91.23 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් |
| 300,000.00 | | 300,000.00 | 53,270.00 | 246,730.00 | 17.76 | 82.24 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ වැඩිදියුණු කිරීම |
| 2,000,000.00 | | 2,000,000.00 | 1,481,630.48 | 518,369.52 | 74.08 | 25.92 | වාහන පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම |
| 4,600,000.00 | 1,000,000.00 | 3,600,000.00 | 1,916,348.28 | 1,683,651.72 | 53.23 | 46.77 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ සහ වෙනත් |
| 4,600,000.00 | 1,000,000.00 | 3,600,000.00 | 1,695,083.71 | 1,904,916.29 | 47.09 | 52.91 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ -අත්පත් කර ගැනීම් |
| 2,000,000.00 | | 2,000,000.00 | 1,381,086.78 | 618,913.22 | 69.05 | 30.95 | ගොඩනැගිලි සහ ඉදිකිරීම්-අත්පත් කර ගැනීම් |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 116,000,000.00 | 9,950,000.00 | 106,050,000.00 | 106,000,000.00 | 50,000.00 | 99.95 | 0.05 | ආයුර්වේද ඖෂධ සංස්ථාව |
| 2,000,000.00 | | 2,000,000.00 | 117,302.00 | 1,882,698.00 | 5.87 | 94.13 | හෙළ වෙද ගෙදර |
| 1,500,000.00 | | 1,500,000.00 | 540,003.00 | 959,997.00 | 36.00 | 64.00 | පුහුණුව හා හැකියා වර්ධනය |
| **136,500,000.00** | **12,450,000.00** | **124,050,000.00** | **113,447,854.73** | **10,602,145.27** | 91.45 | **8.55** | |
| 3,000,000.00 | | 3,000,000.00 | 3,000,000.00 | - | 100.00 | 0.00 | පෝෂණ වැඩසටහන |
| 12,000,000.00 | 5,000,000.00 | 7,000,000.00 | 6,754,428.00 | 245,572.00 | 96.49 | 3.51 | හෝමියෝපති ක්‍රම සංවර්ධනය |
| 95,000,000.00 | | 95,000,000.00 | 84,623,618.85 | 10,376,381.15 | 89.08 | 10.92 | ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ව්‍යාපෘතිය අනුරාධපුර |
| 1,100,000.00 | 488,000.00 | 612,000.00 | 150,000.00 | 462,000.00 | 24.51 | 75.49 | ඔසු ගොවි ගම්මාන වැඩසටහන |
| 800,000.00 | | 800,000.00 | 507,388.92 | 292,611.08 | 63.42 | 36.58 | තරුණ ඔසු ගොවි ගම්මාන වැඩසටහන |
| **111,900,000.00** | **5,488,000.00** | **106,412,000.00** | **95,035,435.77** | **11,376,564.23** | **89.31** | **10.69** | |
| **471,252,000.00** | **22,075,000.00** | **449,177,000.00** | **382,895,258.24** | **66,281,741.76** | **85.24** | **14.76** | |

## දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

## 2012 දෙසැම්බර් 30 දිනට වියදම් වාර්තාව

| | | **ප්‍රතිපාදන** | **වියදම** | **ඉතිරිය** | **වියදමේ ප්‍රතිශතය** | **ඉතිරියේ ප්‍රතිශතය** |
|---|---|---|---|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | පුනරාවර්තන | 54,715,000.00 | 44,977,357.42 | 9,737,642.58 | 82.20 | 17.80 |
| | ප්‍රාග්ධන | 31,825,000.00 | 20,358,626.21 | 11,466,373.79 | 63.97 | 36.03 |
| | | | | | | |
| අමාත්‍යාංශ කාර්යාලය | පුනරාවර්තන | 132,175,000.00 | 109,075,984.11 | 23,099,015.89 | 82.52 | 17.48 |
| | ප්‍රාග්ධන | 230,462,000.00 | 208,483,290.50 | 21,978,709.50 | 90.46 | 9.54 |
| | | | | | | |
| | | | | | | |
| | **එකතුව** | 449,177,000.00 | 382,895,258.24 | 66,281,741.76 | 85.24 | 14.76 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් එකතුව | | 186,890,000.00 | 154,053,341.53 | 32,836,658.47 | 82.43 | 17.57 |
| ප්‍රාග්ධන **වියදම් එකතුව** | | 262,287,000.00 | 228,841,916.71 | 33,445,083.29 | 87.25 | 12.75 |

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

## 2012-12-30 දිනට වියදම් වාර්තාව

| ව්‍යාපෘතිය | ප්‍රතිපාදන | | වියදම (රු) | ඉතිරිය (රු) | වියදම් ප්‍රතිශතය | ඉතිරියේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| පරිපාලන සහ ආයතන සේවා | පුනරාවර්තන | 76,205,000.00 | 74,288,487.00 | 1,916,513.00 | 97.49 | 2.51 |
| | ප්‍රාග්ධන | 10,100,000.00 | 7,565,881.00 | 2,534,119.00 | 74.91 | 25.09 |
| රෝගී ප්‍රතිකාර සේවා | පුනරාවර්තන | 364,814,751.00 | 364,434,374.00 | 380,377.00 | 99.90 | 0.10 |
| | ප්‍රාග්ධන | 178,870,400.00 | 35,667,107.00 | 143,203,293.00 | 19.94 | 80.06 |
| පර්යේෂණ | පුනරාවර්තන | 99,517,676.00 | 99,480,792.00 | 36,884.00 | 99.96 | 0.04 |
| | ප්‍රාග්ධන | 45,160,200.00 | 14,244,327.00 | 30,915,873.00 | 31.54 | 68.46 |
| අධ්‍යාපන සහ පුහුණු කිරීම් | පුනරාවර්තන | 28,842,163.00 | 28,718,361.00 | 123,802.00 | 99.57 | 0.43 |
| | ප්‍රාග්ධන | 5,500,000.00 | 3,543,420.00 | 1,956,580.00 | 64.43 | 35.57 |
| ඖෂධ පැළෑටි සංරක්ෂණය | පුනරාවර්තන | 42,765,410.00 | 42,749,527.00 | 15,883.00 | 99.96 | 0.04 |
| | ප්‍රාග්ධන | 32,150,000.00 | 9,689,089.00 | 22,460,911.00 | 30.14 | 69.86 |

| | | | | | |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන එකතුව | 612,145,000.00 | 609,671,541.00 | 2,473,459.00 | 99.59 | 0.41 |
| ප්‍රාග්ධන එකතුව | 271,780,600.00 | 70,709,824.00 | 201,070,776.00 | 26.01 | 73.99 |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


විගණන විමසුම්-AUDIT QUERY- கணக்காய்வு விசாரணை

විමසීම් අංකය / விசாரணை இலக்கம / Query No.: එච්එම්/සී/එම්අයිඑම්/ජේපීජී/2012

නිකුත් කරන දිනය / வழங்கிய திகதி / Date of issue: 2013 මැයි 31 දින

Addressed to ලේකම්,
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

වෙතටයි

විෂයය / Subject / விடயம்: විසර්ජන ගිණුම - 2012
ශීර්ෂය 138

RECEIVED 04 JUN 2013 MINISTRY OF INDIGENOUS MEDICINE

**මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.**
This is only query calling for information for clarification and not an audit report
இவ்விசாரணை தகவல்களைப் பெற்றுக் கொள்ளவும், பகுப்பாய்வதற்காகவுமே அன்றி
இது ஒரு கணக்காய்வு அறிக்கை அல்ல.

---

දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ 2012 වර්ෂයේ විසර්ජන ගිණුම සම්බන්ධයෙන් කරනු ලැබූ විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

1. විසර්ජන ගිණුම අනුව වියදම් විස්තර

(අ) විසර්ජන ගිණුම අනුව 2012 වර්ෂයේ ශුද්ධ ප්‍රතිපාදනය හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ශුද්ධ ප්‍රතිපාදන | වියදම | ඉතිරිය | ඉතිරි ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු | රු | රු | % |
| පුනරාවර්තන | 190,627,000 | 154,053,341 | 36,573,659 | 19 |
| ප්‍රාග්ධන | 280,625,000 | 228,841,917 | 51,783,083 | 18 |
| එකතුව | 471,252,000 | 382,895,258 | 88,356,742 | 18 |

(ආ) වැය නොකරන ලද ප්‍රතිපාදනය

වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී මු.රෙ. 50(i)(ii)(iii) නියමයන්ට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් කිසිදු වියදමක් නොදරා පහත පරිදි 100% ක් ඉතිරි වී තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

| වැය විෂයය | ශුද්ධ ප්‍රතිපාදනය |
|---|---|
| | රු. |
| 01-01-1506 | 10,000 |
| 01-01-2103 | 400,000 |

RECEIVED 05 JUN 2013 ACCOUNTS BRANCH MINISTRY OF INDIGENOUS MEDICINE


අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
දුරකථනය / தொலைபேசி / Telephone. 2887028-34

இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223

No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

2. අකාර්යක්ෂමව කටයුතු කිරීම සහ ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා

I. නිසි පරිදි අවශ්‍යතා හඳුනා නොගෙන ප්‍රතිපාදන වෙන් කර ගැනීම නිසා පහත පරිදි පුනරාවර්තන වියදම් සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් 40% කට වඩා ඉතිරි වී තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

| වැය විෂයය | ශුද්ධ ප්‍රතිපාදනය | ඉතිරිය | ඉතිරි ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | %. |
| 01-01-1203 | 15,000 | 10,040 | 67 |
| 01-01-1303 | 75,000 | 61,240 | 81.65 |
| 01-01-1403 | 2,000,000 | 1,341,900.44 | 67.09 |
| 01-01-1405 | 2,800,000 | 1,184,457.31 | 42.30 |
| 01-02-1303 | 150,000 | 138,700 | 92.47 |
| 01-02-1403 | 2,500,000 | 1,300,000 | 52 |
| 01-02-1405-01 | 5,000,000 | 4,647,096.94 | 92.94 |
| 01-02-1405-02 | 600,000 | 301,081.43 | 50.18 |
| 01-02-1405-03 | 650,000 | 321,737.04 | 49.5 |
| 01-02-1405-04 | 500,000 | 390,573 | 78.11 |
| 01-02-1405-06 | 6,000,000 | 3,867,006.80 | 64.45 |
| 01-02-1503-02 | 2,050,000 | 2,002,730 | 97.69 |

II. මූලධන වියදම් වලින් පහත පරිදි 40% කට වඩා ඉතිරි වී තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

| වැය විෂයය | ශුද්ධ ප්‍රතිපාදනය | ඉතිරිය | ඉතිරි ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| 01-01-2002 | 600,000 | 570,500 | 95.08 |
| 01-01-2101 | 20,000,000 | 6,066,079.28 | 75.50 |
| 01-02-2001 | 3,500,000 | 3,236,869.52 | 92.48 |
| 01-02-2002 | 300,000 | 246,730 | 82.24 |
| 01-02-2202(1) | 2,000,000 | 1,882,698 | 94.13 |
| 01-02-2401 | 1,500,000 | 959,997 | 64 |

3. ප්‍රතිපාදන අවුරා තැබීම්

ජාතික අයවැය චක්‍රලේඛ 155, 2.2 ඡේදයට අනුව මූලධන වියදම් වලින් ඉතිරි කිරීමේදී, මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, විදේශ මූලායනය යටතේ ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන ව්‍යාපෘති හා පළාත් සභා වල මූලධන වියදම් සඳහා සලසා ඇති ප්‍රතිපාදන ද ඇතුලත්ව ප්‍රතිපාදන වලින් අවශ්‍ය ඉතිරි කිරීම් සිදු කළ යුතු වුවත්,වැය විෂය අංක 138-01-01-2001, 138-01-01-2002 හා 138-01-01-2003 වලින් මුදල් කිසිවක් ඉතිරි කර නොතිබුණි.

4. බැරකම්

I. 2012 දෙසැම්බර් 31 දිනට වූ රු.5,766,765.31 ක් වූ ඇතැම් බැරකම් ගිණුමේ දක්වා නොතිබුණි. (ඇමුණුම 01)

II. මු.රෙ. 94(2) අනුව වාර්ෂිකව පුනරාවර්තනය වන සේවාවන් හෝ සැපයුම් සඳහා බැරකමකට බැඳීමේදී, එසේ බැඳෙන මුදල ගත වූ තුන් අවුරුද්ද තුල ඇස්තමේන්තු ප්‍රතිපාදන මුදල් ප්‍රමාණයෙන් 50% කට වැඩි නොවිය යුතු වුවත්, වැය විෂය අංක 01-02-1205 හි එය රු. 498,500 ක් ව තිබියදී රු. 921,415 ක (විසර්ජන ගිණුමෙහි නොපෙන්වූ බැරකම් සමග) බැරකම් වලට බැඳී තිබුණි.

III. වැය විෂය අංක 01-01-2003 හි ප්‍රතිපාදනයෙන් ඉතිරි මුදල රු. 338,203 ක් වූ අතර එම වැය විෂයය සඳහා රු. 439,810 ක බැරකම් වලට බැඳී තිබුණි.

IV. මු.රෙ.115(3)(ආ) අනුව යම් මුදල් වර්ෂයක නොවැම්බර් 30 දිනට මත්තෙන් ගෙවිය යුතුව තිබුණා වූ මුදලක් එම වර්ෂයේ ගෙවා නොමැතිව පසුව ගෙවීමේදී නිසි අධිකාර බලය ලත් නිලධාරියෙකුගේ සහතිකය මත ගෙවීම කළ හැකි වන නමුත් පහත ගෙවීම් සඳහා එවැනි සහතිකයක් ලබාගෙන නොතිබුණි.

| ගෙවූ දිනය | වවුචර අංකය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|
| 2013.01.07 | 131/34 | 2012 අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාස වල පුවත්පත් බිල්. | 8,480.00 |

| | | | |
|---|---|---|---|
| 2013.01.04 | 131/27 | 2012 සැප්තැම්බර් 01 දින සිට 2012 සැප්තැම්බර් 30 දින දක්වා දුරකථන බිල්පත්. | 1,029.30 |
| | | 2012 ඔක්තෝබර් 01 දින සිට 2012 ඔක්තෝබර් 31 දින දක්වා දුරකථන බිල්පත්. | 902.18 |

5. ජංගම නොවන වත්කම් සංචලනය

I. විසර්ජන ගිණුමේ සටහන (i) හි ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවෙහි වත්කම් වල 2012/01/01 දිනට ආරම්භක ශේෂයන් හා 2011/12/31 දිනට අවසාන ශේෂයන් නොසැසඳුන අතර 2011/01/01 දිනට වූ ආරම්භක ශේෂයන්ම 2012/01/01 දිනට ආරම්භක ශේෂය ලෙස සටහන් කර තිබූ බවත්, 2011/12/31 දිනට මුළු වත්කම් වල වටිනාකම රු.95,941,607 ක් වූ අතර 2012/01/01 දිනට එය රු. 67,848,747 ක් ලෙස විසර්ජන ගිණුමෙහි දක්වා ඇති බවත් නිරීක්ෂණය විය.

II. ස්ථාවර වත්කම් වල මිලදී ගත් දිනය, මිලදී ගත් වටිනාකම, අපහරණය කළ වටිනාකම, හා ශුද්ධ ශේෂය සඳහන් විධිමත් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

6. බැංකු සැසඳුම්

දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලංකා බැංකුවේ මහරගම ශාඛාවේ ගිණුම් අංක 7040752 දරණ බැංකු ගිණුමෙහි 2012 දෙසැම්බර් 31 දිනට මාස 06 ට වැඩි, නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකල චෙක්පත් 06 ක වටිනාකම රු. 129,080.99 ලෙස දක්වා තිබුණි.2012 ජුලි 23 නිකුත් කරන ලද අංක 382359 දරන රු.112,777.79 චෙක් පතද ඊට ඇතුලත්ව තිබුණි. විස්තර පහත දැක්වේ.

| නිකුත් කල දිනය | චෙක්පත් අංකය | වටිනාකම |
|---|---|---|
| | | රු |
| 2011/10/14 | 210858 | 6,525.00 |
| 2012/03/09 | 350941 | 1,750.00 |
| 2012/03/29 | 351051 | 2,350.00 |
| 2012/04/24 | 351198 | 5,568.20 |
| 2012/06/25 | 382196 | 110.00 |
| 2012/07/23 | 382359 | 112,777,.79 |
| | | 129,080.99 |

7. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

මු.රෙ.756 උපදෙස් හා 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 15 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

8. හානි හා පාඩු

මු.රෙ. 104 ප්‍රකාරව හානි හා පාඩු විගණකාධිපති වෙත වාර්තා කර නොතිබූ අතර හානි හා පාඩු ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඔබගේ අදහස් දින 05 ක් තුල විගණනය වෙත දන්වන්නේ නම් මැනවි.

එම්.ජී.සී පෙරේරා

කණ්ඩායම් භාර නිලධාරී

සහකාර විගණකාධිපති වෙනුවට

ඇමුණුම 01

විසර්ජන ගිණුමෙහි නොපෙන්වූ බැරකම්

| දිනය | FC අංකය | වවුචර අංකය | විස්තරය | වැය විෂයය | වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 2013/02/06 | 378 | 132/32 | 2012 දෙසැම්බර් අතිකාල | 1-2-1405-5 | 5,137.00 |
| 2013/02/19 | 488 | 132/93 | 2012.12.28 දින නුවරඑළිය රාජකාරි නවාතැන් ගාස්තු | 1-1-1405 | 2,655.00 |
| 2013/02/15 | 454 | 132/80 | පවිත්‍රතා දීමනා | 1-2-1503-1 | 1,800.00 |
| | 455 | 132/80 | පවිත්‍රතා දීමනා | 1-2-1503-1 | 1,800.00 |
| | 456 | 132/80 | දුරකථන කාඩ්පත් | 1-2-1503-1 | 400.00 |
| 2013/02/15 | 434 | 132/79 | සායනය පිරිසිදු කිරීම 2012 දෙසැම්බර් | 1-2-1503-1 | 1,800.00 |
| | 435 | 132/79 | සායනය පිරිසිදු කිරීම 2012 දෙසැම්බර් | 1-2-1503-1 | 1,800.00 |
| | 437 | 132/79 | සායනය පිරිසිදු කිරීම 2012 දෙසැම්බර් | 1-2-1503-1 | 1,800.00 |
| | 438 | 132/79 | සායනය පිරිසිදු කිරීම 2012 දෙසැම්බර් | 1-2-1503-1 | 1,800.00 |
| 2013/02/13 | 453 | 132/65 | ජංගම දුරකථන බිල් (2012 දෙසැම්බර්) | 1-2-1402 | 725.65 |
| 2013/02/13 | 465 | 132/64 | පුවත්පත් (2012 දෙසැම්බර්) | 1-2-1205 | 892.50 |
| 2013/02/13 | 460 | 132/62 | දුරකථන බිල් (2012 දෙසැම්බර්) | 1-1-1402 | 4,518.53 |
| 2013/02/13 | 441 | 132/61 | දුරකථන බිල් (2012 දෙසැම්බර්) | 1-2-1402 | 3,495.02 |
| | 443 | 132/61 | වෙබ් අඩවිය (2012 දෙසැම්බර්) | 1-2-1402 | 46,531.00 |
| 2013/02/13 | 449 | 132/59 | දුරකථන බිල් (2012 දෙසැම්බර්) | 1-1-1402 | 1,436.11 |
| 2013/02/21 | 494 | 132/111 | දුරකථන බිල් (2012 දෙසැම්බර්) | 1-1-1402 | 606.13 |
| 2013/02/21 | 497 | 132/112 | දුරකථන (2012 දෙසැම්බර්) | 1-2-1402 | 909.93 |
| | | | | | 782.33 |
| 2013/02/21 | 493 | 132/113 | දුරකථන (2012 දෙසැම්බර්) | 1-2-1402 | 2,420.58 |
| 2013/02/26 | 600 | 132/134 | ගමන් වියදම් | 1-2-1405-5 | 1,358.00 |
| | 601 | | අතිකාල (2012 දෙසැම්බර්) | 1-2-1405-5 | 2,594.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2013/02/27 | 565 | 132/142 | වාහන අළුත්වැඩියා (2012/12/26) | 1-1-2003 | 439,810.00 |
| | 566 | | ඉන්ධන (2012/12/26) | 1-1-1202 | 2,000.00 |
| 2013/02/28 | 509 | 132/172 | දුරකථන (11/1-11/30) | 1-2-1405-5 | 2,332.00 |
| 2013/2/28 | 626 | 132/169 | ගමන් වියදම් (201/12/25) | 1-1-1101 | 388.00 |
| | 627 | | අතිකාල (2012/12/25) | 1-1-1002 | 1163.22 |
| 2013/02/28 | 594 | 132/155 | දුරකථන (2012/11) | 1-2-1503-1 | 800.00 |
| | 595 | | විදුලිය (2012/11,12) | 1-2-1503-1 | 300.00 |
| 2013/02/28 | 623 | 132/153 | 1/20 වැටුප් | 1-2-1405-5 | 1,372.50 |
| 2013/02/28 | 427 | 132/152 | නාම පුවරු මුද්‍රණය | 2-3-2502-3 | 32,500.00 |
| 2013/03/08 | 737 | 133/46 | නිවාඩු දින වැටුප් | 1-2-1405-5 | 1,372.50 |
| 2013/03/07 | 695 | 133/29 | දුරකථන (2012/11/05-2012/12/04) | 1-1-1405 | 1,651.95 |
| 2013/03/19 | 853 | 133/100 | දුරකථන (2012 දෙසැම්බර්) | 1-1-1402<br>1-2-1402 | 4,614.65<br>27,189.96 |
| 2013/03/19 | 841 | 133/99 | දුරකථන (2012 දෙසැම්බර්) | 1-1-1402 | 7,923.01 |
| 2013/03/28 | 951 | 133/200 | ඖෂධ සංස්ථාව (2012 දෙසැම්බර්) | 2-3-2502-3 | 5,094,540.00 |
| 2013/03/28 | 934 | 133/192 | දුම්රිය බලපත්‍ර ගාස්තු (2012 අප්‍රේල්) | 2-3-2502-3<br>1-2-1405-5<br>1-2-1101 | 11,520.00<br>1,400.00<br>1,400.00 |
| 2013/03/28 | 933 | 133/191 | දුම්රිය බලපත්‍ර ගාස්තු (2012 අප්‍රේල්) | 2-3-2502-3 | 600.00 |
| 2013/03/28 | 937 | 133/183 | සංග්‍රහ (2012 නොවැම්බර් හා දෙසැම්බර්) | 1-1-1405 | 24,458.00 |
| 2013/03/22 | 910 | 133/158 | අතිකාල (2012 ඔක්තෝබර්, නොවැම්බර්) | 1-2-1405-5 | 10,170.74 |
| 2013/01/04 | 62 | 131/24 | ඉන්ධන (2012 දෙසැම්බර්) | 1-1-1202 | 6,297.00 |
| 2013/01/03 | 38 | 131/02 | ගමන් වියදම් | 1-1-1101 | 2,625.00 |
| | 39 | 131/02 | ගමන් වියදම් (2012 දෙසැම්බර්) | 1-1-1101 | 2,450.00 |
| 2013/01/06 | 87 | 131/97 | ගමන් වියදම් | 1-4-1101 | 2,625.00 |
| | එකතුව | | | | 5,766,765.31 |

# ස්තූතියි !